


# චතුරාර්‍යසත්‍ය විභාගය

# වැලිවිට පිණ්ඩපාතික සරණඞ්කර සංඝරාජ

මහා ස්වාමිපාදයන්වහන්සේ විසින්

සඞ්ගෘහිත

# චතුරාර්‍ය්‍ය සත්‍ය විභාගය.

සමණ්ඩ ස්වාමිපාදයන්වහන්සේ නමක් ලවා

සකස්කරවාගෙණ

හෝමාගම

## ඩී. සී. වික්‍රමසිංහ අප්පුහාමි

විසින්

කොළඹ

විද්‍යාප්‍රකාශ යන්ත්‍රාලයෙහි

මුද්‍රණය කරවනලදි.

1927.

# චතුරාර්‍ය්‍යසත්‍ය විභාගය.

**නමො තස්ස භගවතො අරහතො**
**සම්මා සම්බුද්ධස්ස**

චත්තාරිමානි භික්ඛවෙ අරියසච්චානි කතමානි චත්තාරි? දුක්ඛං අරියසච්චං දුක්ඛසමුදයං අරියසච්චං දුක්ඛනිරොධං අරියසච්චං දුක්ඛ නිරොධගාමිණී පටිපදා අරියසච්චං ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අරියසච්චානි අරියා ඉමානි පටිවිජ්ඣන්ති තස්මා අරියසච්චානී'ති වුච්චන්තීති.

යනාදීන් වදාළ චතුස්සත්‍ය ධර්මයන්ගේ විභාග දක්වනුවෝ ප්‍රථමකොට

විභාගතො නිබ්බචන ලක්ඛණාදිප්පභෙදතො
අත්ථත්ථුද්ධාරතො චෙව අනූනාධිකතො තථා
කමතො ජාති ආදීනං නිච්ඡයා ඤාණ කිච්චතො
අන්තොගධානං පභෙදා උපමාතො චතුක්කතො
සුඤ්ඤතෙකවිධාදීහි සභාගවිසභාගතො
විනිච්ඡයො වෙදිතබ්බො විඤ්ඤුනා සාසනක්කමෙ-යි.

යනු ආරබ්ධයි. එහි **විභාගතො** යනෙනැහි දුක්ඛාදී චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ වදාළනාක් අර්ථයෝ අමෘත ස්වභාව ඇති බැවින් අවිතථයහ අන්‍යාකාර රහිත බැවින් අනඤ්ඤථයහයි යනාදීන්විභාගකළ පරිදිදතයුතු-තවද දුඃඛසත්‍යයෙහි පීළනඨය සංඛතඨය සන්තාපඨය විපරිණාමඨයයි කියා සතර ධර්ම කෙනෙක් වෙති. එහි **පීළනඨ** නම් සසර රාගාදී කෙලෙසුන් විසින් පෙළෙනබවයි. **සංඛතඨ** නම්ප්‍රත්‍යයන් විසින් රැස්කරණලද ස්වභාවය ප්‍රත්‍යයෝ නම් පඤ්චස්කන්ධයෝයි **සන්තාපඨ** නම් රාගාදී කෙලශයන් විසින් තවන ස්වභාවය **විපරිණාමඨ** නම් ජරා මරණ දෙකින් පෙරළෙන ස්වභාවය සමුදය සත්‍යයෙහිදු ආයූහනඨය නිදානඨය සංයොගඨය පළිබොධඨයයි කියාසතර ධර්ම කෙනෙක් වෙති. එහි **ආයූහනඨ** නම් කුශලාකුශල කර්මයන් රැස්කරණ ස්වභාවය හෙවත් දුක් රැස්කරණ ස්වභාවය.

**මෙම කීහ විශුද්ධිමාර්ග ටීකාවෙහි**

"තත්‍ර තත්‍රාභිනන්දන වසෙන ව්‍යාපිත්වා ඌහනං රාසිකරණං දුක්ඛස්ස නිබ්බත්තනං ආයූහනංයි. **නිදානඨ** නම සසර පිහිටුවන බවය හෙවත් දුකට කාරුණුවන ස්වභාවයි. මේද කීහ ටීකාවෙහි නිය්‍යාත දුක්ඛන්ත නිදෙතාං ඉදං තං දුක්ඛන්ති සම්පට්ඨපෙන්තංවිය සමුඨපෙතියි" **සංයොගඨ** නම සංසාරය හා එක් කොට යොදන ස්වභාවය **පලිබොධය** නම් සසර බැලා විලසා

අනාදිමත් සසර සිටුවනු ස්වභාවය නිරෝධසත්‍යයෙහි නිස්සරණට්ඨය විවෙකට්ඨය අසංඛතට්ඨය අමතට්ඨයයි කියා සතර ධර්ම කෙණෙක් වෙති. එහි නිස්සරනට්ඨ නම් සසර හා නොහැනි පහවූ ස්වභාවය විවෙකට්ඨ නම් සසර නැමැති මහ සතරින් වෙන්වූ නිරාකුලවූ විවෙක ස්ථාන ඇති ස්වභාවය අසංඛතට්ඨ නම් හෙතුනිසා නොවුපන් ස්වභාවය අමතට්ඨ නම් භඟ නැති බැවින් අමරණ ස්වභාවය මාර්ගසත්‍යයෙහිද නිය්‍යානට්ඨය හෙතට්ඨය දස්සනට්ඨය ආධිපතෙය්‍යට්ඨයයිකියා සතර ධර්මකෙනෙක් වෙති. එහි නිය්‍යානට්ඨ නම් සංස්කාරයන් අරමුණු නොකොට සියලු සංස්කාරයෙන් නික්මෙනබැවිනුදු සත්වයන් සංසාරයෙන් නෙරන බැවිනුදු නිය්‍යාන ස්වභාවය හෙවත් නිවන්පසක්කරන ස්වභාවය හෙතට්ඨ නම් මොක්ෂයට සම්ප්‍රාප්ත හෙතු ස්වභාවය "පලිබොධුපච්ඡෙදනෙන නිබ්බාණාධි ගමාව නිබ්බාණ නිමිත්තතා මග්ගස්ස හෙතට්ඨො" යනු මෙයටම ටීකාසි. දස්සනට්ඨ නම් මාර්ගය ප්‍රඥා ප්‍රධාන බැවින් නෛර්‍යාණිය හෝ චතුස්සත්‍යය හෝ දක්නාස්වභාවය හෙවත් නිවන්දක්නාස්වභාවය ආධිපතෙය්‍යට්ඨ නම් සම්ප්‍රයුක්තයන් තමා වසයෙහි පවත්වන ස්වභාවය හෙවත් අනන්තාපරිමාණ සක්වල තමා සරි කෙනෙකුන් නැති බැවින් ආධිපතෙය්‍ය ස්වභාවය යන මේ සතර සත්‍යයෙහිම කියනලද සතර සතර ධර්මයෝ එක්කොට සොළසෙක් වෙති. මොහු සියල්ලම ඒ ඒ සත්‍යයට කියනලද ක්‍රමයෙන් තත් ස්වභාවය හා මුසා නොවන ස්වභාවය ඇතිබැවින් අවිතථයහ. අන්‍යාකාර නොවන බැවින් අනඤ්ඤථයහයි දතයුතු,

## එසින් වදාලහ.

දුක්ඛස්ස පීලනට්ඨො සංඛතට්ඨො සන්තාපට්ඨො විපරිනාමට්ඨො ඉමෙ චත්තාරො දුක්ඛස්ස දුක්ඛට්ඨා තථා අවිතථා අනඤ්ඤථා සමුදයස්ස ආයුහනට්ඨො නිදානට්ඨො සංයොගට්ඨො පලිබොධට්ඨො නිරොධස්ස නිස්සරණට්ඨො විවෙකට්ඨො අසංඛතට්ඨො අමතට්ඨො මග්ගස්ස නිය්‍යාණට්ඨො හෙතට්ඨො දස්සනට්ඨො ආධිපතෙය්‍යට්ඨො ඉමෙ චත්තාරො මග්ගස්ස මග්ගට්ඨා තථා අවිතථා අනඤ්ඤථා-යි.

මෙතෙකින් විභාගතො යන්නෙහි විනිශ්චය දතයුතු "නිබ්බචන ලක්ඛණාදිප්පභෙදතො" යන්නෙහි නීහරිත්වා වත්තබ්බං වචනං=නිබ්බචනං, කී බැවින් අක්ෂරචාරයෙන් අර්ථ නොහැර කීම නිර්වචන නම් වේ. අක්ෂරචාරයෙන් අර්ථ නැර කියන ක්‍රම නම් පලමුවන දුඃඛ සත්‍යයෙහි දු ශබ්දය කුත්සිතාර්ථයෙහි දක්නාලැබෙති, යම් හෙයකින් කුත්සිතවූ පුත්‍රයහට දුපුත්‍රයයිකියද්ද

එසෙයින් දුක්ඛසත්‍යයෙහි ද ශබ්දය කුත්සිතාර්ථයෙහි වැටේයි. ඛම සත්‍යයෙහිවනාහි ඛශබ්දය තුච්ඡාර්ථයෙහි වැටෙයි යම් හෙයකින් ආකාසය ඛයයි කියනු ලැබේද එසෙයින්ම මේ පළමුවන සත්‍යයද අනෙකොපද්‍රවාධිෂ්ඨානවන බැවින් කුච්ඡිතවෙයි. බාල ජනපරිකල්පිත නිත්‍යසුභ සුඛාත්මභාව රහිතවක බැවින් තුච්ඡ වෙයි මෙසේ කුත්සිතවනබැවින් හා තුච්ඡවනබැවින්ද දුක්ඛංයයි කියනුලැබේ. එයින් කීහ විශුද්ධිමාර්ගයෙහි සොළොස්වන ඉන්ද්‍රිය සත්‍යනිර්දේශයෙහි; "තිබ්බවනතොනාව ඉධ දු ඉති අයං සද්දො කුච්ඡිතෙ දිස්සති කුච්ඡිතංහි පුත්තං දු පුත්තොති වදන්ති ඛ සද්දො පන තුච්ඡෙ තුච්ඡං හි ආකාසං ඛන්ති වුච්චති ඉදඤ්ච පඨම සච්චං කුච්ඡිතං අනෙකඋපද්දවාධිට්ඨානතො තුච්ඡං බාලජනපරිකප්පිත ධුව සුභ සුඛත්තභාව විරහිතතො තස්මා කුච්ඡිතත්තා තුච්ඡත්තා ච දුඛන්ති වුච්චති"-යි. දෙවෙනි සමුදය සත්‍යයෙහි සං යන මේ ශබ්දයතෙමේ සමාගමයෙහි වැටෙයි සමෙතං යනාදියෙහි සංයොගය ප්‍රකාශ කෙරෙයි. උ යන මේ ශබ්දය උප්පන්නං උදිතං යනාදියෙහි උත්පත්තියෙහි වැටෙයි. අය ශබ්දය කාරණය ප්‍රකාශකෙරෙයි. මේ දෙවෙනි සත්‍යය අවශෙෂප්‍රත්‍යයන්ගේ සමාගමයක් ඇති කල්හි දුක්ඛයාගේ උත්පත්තියට කාරණාවෙයි. දුක්ඛයාගේ සංයොගොත්පත්තියට කාරණාවන බැවින් දුක්ඛසමුදයයි කියනුලැබේ.

එයින් කීහ,

සං ඉතිච අයං සද්දො සමාගමෙ සමෙතන්ති ආදිසු සංයොගං දීපෙති උ ඉති අයං උප්පන්නං උදිතන්ති ආදිසු උප්පත්තිං අයං සද්දො කාරණං දීපෙති ඉදඤ්චාපි දුතියසච්චං අවසෙසපච්චය සමායොගෙ සති දුක්ඛස්සුප්පත්ති කාරණන්ති දුක්ඛස්ස සංයොගෙ උප්පත්ති කාරණතො දුක්ඛසමුදයන්ති වුච්චති-යි.

තෘතීය සත්‍යයෙහි වනාහි යම්හෙයකින් නි ශබ්දය අභාවය ප්‍රකාශකෙරේද රොධ ශබ්දය චාරක ප්‍රකාශකෙරේද එහෙයින් මේ සංසාර චාරකයයි කියනලද දුක්ඛරොධයාගේ අභාවය සම්ගතිශූන්‍යවන බැවින් නිරොධයහටනුයි දුක්ඛනිරොධ නම් වේ.

මෙද විස්තරවශයෙන් දක්වනු ලැබේ.

තතිය සච්චං පන යස්මා නිසද්දො අභාවං රොධ සද්දො චාරකං දීපෙති තස්මා අභාවො එත්ථ සංසාර චාරකසංඛාතස්ස දුක්ඛ නිරොධස්ස සබ්බගති සුඤ්ඤත්තා සමධිගතෙවා තස්මිං සංසාර චාරක සංඛාතස්ස දුක්ඛනිරොධස්ස අභාවො හොති තප්පටිපක්ඛත්තාති පි දුක්ඛනිරොධන්ති පි වුච්චති දුක්ඛස්ස වා අනුප්පාද නිරොධපච්චයත්තා දුක්ඛනිරොධන්ති-යි.

සතරවන සත්‍යය වනාහි යමකින් මේ දුක්ඛනිරෝධයට යේද දුක්ඛ නිරෝධයට පමුණුවන ප්‍රතිපත්තිය තදභිමුඛීභූතවන බැවින් මාර්ගවේ,

එසින් කීහ.

චතුත්ථ සච්චං පන යස්මා එතං දුක්ඛනිරෝධං ගච්ඡති ආරම්මණවසෙන තදභිමුඛභූතත්තා පටිපදාච හොති දුක්ඛනිරෝධ පපත්තියායි කවරහෙයකින් ආර්‍යසත්‍යයයි කියනු ලැබෙද්දයත් යම්හෙයකින් වනාහි බුද්ධාදී ආර්‍යයෝ මේ චතුස්සත්‍යයන් ප්‍රතිවෙධ කෙරෙද්ද එහෙයින් ආර්‍යසත්‍යයයි කියනු ලැබෙත්.

එසින් වදාළහ.

චත්තාරිමානි භික්ඛවෙ අරියසච්චානි කතමානි චත්තාරි දුක්ඛං අරියසච්චං දුක්ඛසමුදයං අරියසච්චං දුක්ඛනිරොධං අරියසච්චං දුක්ඛනිරොධගාමිනි පටිපදා අරියසච්චං ඉමානිඛො භික්ඛවෙ චත්තාරි අරියසච්චානි අරියා ඉමානි පටිවිජ්ඣන්ති තස්මා අරියසච්චානීති වුච්චන්ති-යි,

අපිච සතරාමරලොකයෙහි බුදුහු ආර්‍යනම් වනසේක මේ ආර්‍ය සත්‍යයෝ බුදුන්ගේනුයි ආර්‍යසත්‍ය නම්වෙත්,

එසින් වදාළහ.

සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය තථාගතො අරියො තස්මා අරියසච්චානීති වුච්චන්ති-යි,

නොහොත් මේ චතුරාර්‍ය සත්‍යයන්ගේ ආර්‍යභාව සිද්ධියෙන් අභිසම්බුද්ධ හෙයින්ද ආර්‍යසත්‍ය නම්වෙත්,

එසින් වදාළහ.

ඉමෙසං ඛො භික්ඛවෙ චතුන්නං අරියසච්චානං යථාභූතං අභිසම්බුද්ධත්තා තථාගතො අරහං සම්මාසම්බුද්ධොති වුච්චති-යි

අපිච ඛො පන ආර්‍යවූ සත්‍යයෝනුයි කියා ආර්‍යසත්‍යයෝ නම්වෙත් ආර්‍ය නම් අමෘෂාවාදය අවිසංවාදය යනු අර්ථයි.

එසින් වදාළහ.

ඉමානිඛො භික්ඛවෙ චත්තාරි අරියසච්චානි තථානි අවිතථානි අනඤ්ඤථානි තස්මා අරියසච්චානීති වුච්චන්ති-යි.

මෙසේ විනිශ්චය කරණලද නිර්වචන සංඛ්‍යාත අක්ෂරචාර යෙන් අර්ථනැර කියන ක්‍රමයට ගාම්භීරවූ ශ්‍රීමුඛපාළිය හාඅටුවා පාඨය සම්බන්ධවූ හෙයින් දුරවබොධයහේ නම්-දුක්ඛසත්‍යයෙහි දු ශබ්දය කුත්සිතාර්ථයෙහි වැටේ. ඛ ශබ්දය තුච්ඡාර්ථයෙහි වැටේ පළමුවන සත්‍යය අනෙකොපද්‍රවාධිෂ්ඨානවන බැවින් කුත්සිතයි බාලජන පරිකල්පිත නිත්‍යසුභ සුඛාත්මභාව රහිතවන බැවින් තුච්ඡයයි මෙසේ කුත්සිත වනබැවින් දුක්ඛවෙ—සමුදය සත්‍යයෙහි සං යනු සංයොගයෙහිවැටෙයි උයනුඋත්පත්තියෙහි වැටෙයි අය ශබ්දය කාරණයෙහි වැටෙයි මෙසේ දෙවනසත්‍යය සමායොගයක් ඇතිකල්හි දුකොත්පත්තියට කාරණාවන බැවින් සමුදයවේ. නිරොධසත්‍යයෙහි නි ශබ්දය අභාවයෙහිවැටේ රොධ ශබ්දය චාරකයෙහිවේ චාරකනම් දඟගෙයයි මෙසේතුන්වන සත්‍යය සර්වගති ශූන්‍යවනබැවින් සංසාරචාරක සංඛ්‍යාතවූ දුක්ඛනිරොධයාගේ අභාවයහෙයින් නිරොධවේ-සතරවනසත්‍යයදුක්ඛ නිරොධයට පමුණුවන ප්‍රතිපත්ති ආලම්බණ වශයෙන් තදභිමුඛ භූතවනබැවින් මාර්ගවනෙනායයි කියා නවගුණ සත්‍යයෙහි පූර්වාචාරීන් විසින් කළ විනිශ්චයද පිරික්සියයුතු මෙතෙකින් නිර්වචන විසින් විනිශ්චය දතයුතුයි-ලක්ෂණාදීන්ගේ ප්‍රභෙදහෙයින් අර්ථ කියනක්‍රම කෙසේදයත්? "බාධනලක්ඛණං දුක්ඛසච්චං" කීබැවින් දුක්ඛසත්‍යය බාධන සංඛ්‍යාත පීඩාව ලක්ෂණකොට ඇත්තේය දුක්ඛසත්‍යයෙහි රස කෙසේදයත්? "සන්තාපන රසං" කී බැවින් තවනනාවූ කෘත්‍යඇත්තේයි මෙහි කෘත්‍ය සරසය යනු එකාර්ථයි භවාදියෙහි ජාත්‍යාදී වශයෙනුදු චක්ඛු රොගාදි වශයෙනුදු අනෙකප්‍රකාරයෙන් දුක්ඛ ප්‍රවර්තනයෙම පුද්ගලයාගෙ සන්තාපන නැමැයිදතයුතු. දුක්ඛසත්‍යයෙහිප්‍රත්‍යුපස්ථාන කෙසේදයත්? "පවත්තිපච්චුපට්ඨානං"යි කීබැවින් ප්‍රවෘත්තිය ප්‍රත්‍යුපස්ථාන නම්වේ ප්‍රත්‍යුපස්ථානනම් වැටහීමයි. මෙතෙකින් දුක්ඛසත්‍යයෙහි ලක්ෂණය රසය ප්‍රත්‍යුපස්ථානය යන මොවුන්ගේ විනිශචය දතයුතුයි-සමුදයසත්‍යයෙහි ලක්ෂණ කෙසේදයත්? "පභවලක්ඛණං සමුදය සච්චං":යි කී බැවින් සමුදය සත්‍යය ප්‍රභව ලක්ෂණකොට ඇත්තේය ප්‍රභවනම් මූල සවභාව ඇත්තේය. උපදවන සවභාව ඇත්තේය යන අර්ථයි. පභවති එතසමා දුක්ඛං නිබ්බත්තතීති-පභවො- පූර්වභවයෙන් පශ්චිම භවය සර්තව සංයුක්තව පවතීනුයි. පභව නම්වේ සමුදය සත්‍යයෙහි රස කෙසේදයත්? "අනුපච්ඡෙද කරණරසං"ති කී බැවින් නැවත නැවත උත්පාදනයයි කියනලද අනුපච්ඡෙදකරණය

රසනම්වේ. හෙවත් දුක්ඛ අවිච්ජින්නාකරණය කෘත්‍යයවෙ සමුදය සත්‍යයෙහි ප්‍රත්‍යුපස්ථාන කෙසේදයත්? "පලිබොධ පච්චුපට්ඨානංයි" කිහෙයින් සසරින් නික්මියනොදෙන පලිබොධය වැටහීම්කොට ඇත්තේය මෙතෙකින් සමුදය සත්‍යයෙහි ලක්ෂණය රසය ප්‍රත්‍යුපස්ථානය යන මොවුන්ගේ විනිශ්චය දතයුතු. නිරොධ සත්‍යයෙහි ලක්ෂණ කෙසේදයත්? "සන්ති ලක්ඛණං නිරොධසච්චං"යි කී බැවින් කිසිසේත් කෙලශයන් විසින් තවාගත නොහෙතබැවින් නිවුනාවූ ශාන්ත බව ලක්ෂණකොටඇත්තේය "රාගක්ඛයාදිභාවෙන සබ්බදුක්ඛසන්තතාය නං" යනු මෙයටම ටීකාසි. නිරොධසත්‍යයෙහි රස කෙසේදයත්? "අච්චුතිරසං"යි කීබැවින් නොනස්නාබව සම්පත්කොටඇත්තේය මෙහිදුසම්පත්තිය රසයකෘත්‍යයයනු එකාර්ථයි. "අච්චුතකිච්චං වා කිච්චන්ති වචනාභාවං කිච්චමිව කත්වා පරියායෙන වුත්තං අච්චුතස්ස භාවා පරිජනං අවිකාරිතාදක්ඛා" යනු මෙයටම ටීකාසි. නිරොධ සත්‍යයෙහි ප්‍රත්‍යුපස්ථාන කෙසේදයත්? "අනිමිත්ත පච්චුපට්ඨානං"යි කී බැවින් සකන්ධ නිමිත්තයෙන් විවික්ත වන බැවින් අනිමිත්තව අවිග්‍රහව වැටහීම්කොට ඇත්තේ වෙයි, මෙතෙකින් නිරොධසත්‍යයෙහි ලක්ෂණය රසය ප්‍රත්‍යුපස්ථානය යන මොවුන්ගේ විනිශ්චය දතයුතුයි-මාර්ගසත්‍යයෙහි ලක්ෂණ කෙසේදයත්? "නිය්‍යාන ලක්ඛණං මග්ගසච්චං"යි කී බැවින් නිවණට යන සවභාව ඇත්තේ සසරින් පහවන සවභාව ඇත්තේ මාර්ගසත්‍යයෙහි ලක්ෂණ වේ. "අනුසය සමුච්ඡින්දනෙන සංසාර චාරකතො නිග්ගමනූපායභාවො නිය්‍යානං"යි යනු මෙයටම ටීකාසි. මාර්ගසත්‍යයෙහි රස කෙසේදයත්?"කිලෙසප්පහානකාරණරසං"යි කීබැවින් අනුත්පාද නිරොධ වශයෙන් කෙලෙසුන් ප්‍රහාණ කාරණබව කෘත්‍යය (කොට) රසකොට ඇත්තේය, මාර්ගසත්‍යයෙහි ප්‍රත්‍යුපස්ථාන කෙසේදයත්? "වුට්ඨාන පච්චුපට්ඨානං"යි කී බැවින් නිමිත්තයනුදු නැගෙනුව වැටහෙන්නේයි නිරොධ සත්‍යයටද පදස්ථාන නැති බැවින් ඒ හා සමග කියන සෙසු තුන්සත්‍යයටද පදස්ථාන නොකීයෙත්. මෙතෙකින් මාර්ගසත්‍යයෙහි ලක්ෂණය රසය ප්‍රත්‍යුපස්ථානය යන මොවුන්ගේ විනිශ්චය දතයුතුයි 'අත්ථත්‍රුඩාරතො වෙව'' යන මෙහි වනාහි අර්ථහෙයින් පළමු කොට අර්ථවිසින් කවරෙක් සත්‍යදැයි කිවහොත් ප්‍රඥාචක්ෂුසින් පරීක්ෂාකරනු ලබන්නාවූ බුධාදීන්ට අසවර්ණම සවර්ණකොට දක්වන මායාකාරයාගේ ක්‍රියාවක්මෙන් විපරීත නොදවෙයි, වස්තු මාත්‍රයකුදු නැතිබැවින් මිරිඟු දිය බඳුව පෙණෙන බැවින් විසංවාදනය කාරණ මිරිඟුමෙන් විසංවාදක නොදවෙයි. කවර

ශෙයක්නිදු නොදක්නා හැකි බැවින් නොලැබියහැක් සවභාව ඇතිවූ තිර්ථකයන්ගේ ආත්මභාවමෙන් නොලැබිය හැකි සවභාවද ඇත්තේ නොවෙයි, කෙසේදයත්? ඒකාන්තයෙන්ම බාධන ලක්ෂණයෙන් දුඃඛසත්‍යයවෙයි. ප්‍රභව ලක්ෂණයෙන් සමුදයසත්‍යයද ශාන්තිලක්ෂණයෙන් නිරොධසත්‍යයද නියර්‍යාණ ලක්ෂණයෙන් මාර්ගසත්‍යයද වෙයි. හෙද තථ්‍යාවිපරීත භූත සවභාවෙන් වෙයි, හෙවත් මරිචිසෙයින් විසංවාද නොවන බැවින් භූත සවභාවයෙන් හෙවත් මරීචිසෙයින් විසංවාදන නොවන බැවින් තථ්‍යවූ මායාසෙයින් විපරිත නොවනබැවින්අවිපරිතවූ තීර්ථකයන්ගේ ආත්මසෙයින් අනුපලභ්‍යසවභාව නොවන බැවින් භූතවූ සවභාවයෙන් වැටහීම් වශයෙන් ප්‍රතිවෙධ වශයෙන් අරමුණු වශයෙන් ආර්‍යඥානයට ගොචරවෙයි, ලැහැළිආදී උපාදන වශයෙන් ශක්ලිකාග්නිය යනාදි ප්‍රභෙදහෙතුදු උෂ්ණත්වයෙන් එක්වූ වහ්නි ලක්ෂණ මෙන්ද ලොකප්‍රකෘතියමෙන්ද තථ්‍යාවිපරීත භූතභාවය සත්‍යාර්ථ නමැයි වෙදිතව්‍යයි,

එයින් වදාළහ බුද්ධඝොෂ මහ තෙරහු.

අත්ථුද්ධාරතො චෙවා'ති එත්ථ පන අත්ථතොතාව කො සච්චට්ඨොතිචෙ? යො පඤ්ඤා චක්ඛුනා උපපරික්ඛමානානං මායාව විපරීතකො මරීචිව විසංවාදකො තිත්ථියානං අත්තාව අනුපලබ්භනෙය්‍ය භාවො ච න හොති. අථකො බාධනප්පභවසන්ති නීය්‍යානප්ප කාරෙණ තච්ඡා 'විපරීත භාවෙන අරිය ඤාණස්ස ගොචරො හොති යෙව එස අග්ගි ලක්ඛණං විය ලොකපකතිවියච තච්ඡා 'විපරීතභූත භාවො සච්චට්ඨොති වෙදිතබ්බො-යි.

අපිච කවරකාරණයකින් දුක්ඛය සත්‍යයයි කියනු ලැබේදයත්?

නාබාධකං යතො දුක්ඛං දුක්ඛාඅඤ්ඤං න බාධකං,
බාධකත්තනියාමෙන තතො සච්ච මිදං මතං—යි.

දක්වනලද බැවින් යම්හෙයකින් යම්කාරණයකින් දුක්ඛය තෙමේ නොපෙලෙන්නේ නොවේද පෙලෙන්නේම වේද දුඃඛ සත්‍යයෙන් පිටත් බාධක දෙයෙක් නැත්ද ඒ කාරණයෙන් දුඃඛ සත්‍යය බාධකමය දුක්ඛමය හෝ බාධකයයි මෙසේ දෙපරිද්දකින්ම දුඃඛසත්‍යයයි සලකනලදී, කවර කාරණයකින් සමුදය සත්‍යයයි කියනු ලැබේදයත්?

තං විනා නාඤ්ඤතො දුක්ඛං න හොති නච තං තතො,
දුක්ඛ හෙතු නියාමෙන ඉති සච්චං විසත්තිකා-යි.

යනුහෙයින් ඒ විසත්තිකා තෘෂ්ණාව හැර අනිකෙකින් දුක්ඛය නොවේද ඒ දුක්ඛය ඒ විසත්තිකා තෘෂ්ණාවෙන් නොවනුයේ නොවේද මෙසේ දුක්ඛයට හේතුභාවයෙහි නියමයෙන් විසත්තිකා සංඛ්‍යාත තෘෂ්ණාතොමෝ සත්‍යනම්වේ, අවශෙෂ කෙලශාදීන්ගේ දුක්ඛය හෙතුභාවය ඇතද තෘෂ්ණාව හැර ඔවුන්ගේ දුක්ඛයට හෙතුභාවය නොවෙයි. ඔවුන් හැර තෘෂ්ණාවගේ දුක්ඛයට හෙතුභාවයවේ,

## මෙම කීහ විශුද්ධිමාර්ගී ටීකාශෙහි

සතිපි අවසෙස කිලෙස අවසෙස කුසල සාසවකුසල මූලා අවසෙස සාසව කුසල ධම්මානං දුක්ඛහෙතුභාවෙන තණ්හාය විනා තෙසං දුක්ඛහෙතු භාවො අත්ථි තෙහි පන විනාපි තණ්හාය දුක්ඛ හෙතු භාවො අත්ථි කුසලෙහි විනා අකුසලෙහි රූපාවචරාදි කුසලෙහි විනා කාමාවචරාදීහි ච තණ්හාය දුක්ඛ නිබ්බත්තනකභාවා-යි

කවර කාරණයකින් නිර්වාණය නිරොධසත්‍ය නම්වේදයත්,

නාඤ්ඤ නිබ්බාණතො සන්ති සන්තං තව නතං යතො
සන්තභාවනියාමෙන තතො සච්ච මිදං මතං-යි.

දක්වනලද බැවින් යම් කරුණකින් නිර්වාණයෙන් පිටත් අනික් ශාන්තියෙක් නැද්ද ඒ නිර්වාණය අශාන්ත නොවේද ශාන්තමවේද ඒ කාරණයෙන් ශාන්තභාව නියමයෙන් මේ නිර්වාණය සත්‍යයයි සලකනලදී, මාර්ගසත්‍යය කවරකාරණයකින් සත්‍යයයි කියනු ලැබේදයත්?

මග්ගා අඤ්ඤං න නිය්‍යානං අනිය්‍යානො න චාපිසො,
තච්ඡනිය්‍යාන භාවත්තා ඉතිසො සච්ච සම්මතො-යි.

දක්වනලද බැවින් මාර්ගසත්‍යයෙන් පිටත් අන්‍යවූ නෛර්යාණයෙක් නැද්ද මාර්ගසත්‍යය තෙමේ නොඅනෛර්යාණික වේද නෛර්යාණිකමවේද මෙසේ තථ්‍යාවනෛර්යාණවූ බැවින් ඒ මාර්ගසත්‍යයයි සලකනලදී.

විධාපිතියාමෙන තච්ඡා නීයානභාවො එතස්ස මිච්ඡාමග්ගස්සවිය විපරීතතාය න ලොකියමග්ගස්ස විය වා අනෙකන්තිකතාය අතච්ඡාති තච්ඡනිය්‍යානභාවො මග්ගො තස්සභාවො තච්ඡනිය්‍යානභාවත්තං තස්මා තච්ඡනිය්‍යාන භාවත්තා" යනු මෙයටම විශුද්ධිමාර්ගී ටීකායි,

මෙ විවිධ නියමයෙන් තථ්‍යවූ අවිපරීතවූ අසත්ත්වය දුක්ඛාදී සතරදෙනා කෙරෙහි සාමාන්‍යයෙන් සත්‍යාර්ථයයි කියා පණ්ඩිතයෝ කියත්,

එසින් කීහ.

ඉති තච්ඡා' විපල්ලාස භූතභාවං චතුස්වපි
දුක්ඛාදිසු විසෙසෙන සච්චඨං ආහු පණ්ඩිතා-යි.

මෙසේ අර්ථ විසින් අර්ථ විනිශ්චය දතයුතුයි අත්‍ථුද්ධාරයෙහෙයින් අර්ථ කියන ක්‍රම කෙසේදයත්? මෙතැන්හි සච්ච ශබ්දය අනෙකාර්ථයෙහි දක්නා ලැබේ. කෙසේදයත්? "සච්චං භණෙ න කුජ්ඣෙය්‍ය"ති යනාදීතන්හි වාක්සත්‍යයෙහි වැටෙයි. "සච්චෙ ඨිතා සමණබ්‍රාහමණාචාති" යනාදී තන්හි යමකින් වෙන්වෙන විරතිසත්‍යයෙහි වැටෙයි. "ඉදමෙව සච්චං මොඝමඤ්ඤං" යන තන්හි දෘෂ්ටිසත්‍යයෙහි වැටෙයි. "එකංහි සච්චං න දුතියං" යනාදී තන්හි පරමාර්ථ සත්‍යයෙහි වැටෙයි "චතුන්නං සච්චානං කති කුසලා"යි යනාදී තන්හි ආර්‍ය්‍ය සත්‍යයෙහි වැටෙයි. ඒ මේ සත්‍ය ශබ්දතෙමෙ මෙතැන්හි ආර්‍ය්‍යසත්‍යයෙහි වැටේ, අභිධාන ප්‍රදීපිකායෙහි කියනලදමැයි·

නිබ්බාණ මග්ග විරති සපථෙ සච්ච භාසිතෙ
තච්ඡෙ චාරිය සච්චම්හි දිඨියං සච්චමීරිතං-යි.

මෙසේ මෙහි අත්‍ථුද්ධාර විසින් විනිශ්චය දතයුතුයි, අත්‍ථුද්ධාර නම් සත්‍ය ශබ්දයෙහි සම්භවන අර්ථයන්ගේ උද්ධරණය හා සමග වන අර්ථයන් දක්වා අභිප්‍රෙතාර්ථයාගේ උද්ධරණය නිර්ණය අර්ථොද්ධාර නමැයිද දතයුතු, අනූනාධිකතො යනුවෙන් කවර හෙයකින් "චත්තාරි අරියසච්චානි"යි කියා සතරක්ම කියන ලද්දයත්? බොහෝවක් මදකොට කිවහොත් ඌන දොෂය වෙයි මදක් බොහෝව කිවහොත් අධික දොෂයවෙයි, ඒ දොෂවය මූදා අනූන අනධිකකොට "චත්තාරි අරියසච්චානි"යි කිහු-නොහොත් ආර්‍ය්‍යසත්‍ය කෙනෙක් මේ සතරට වඩා නොදැති මේ සතරින් ආර්‍ය්‍යසත්‍යයන් කෙරෙහි නොමගණ හැරියයුතු එක කුදු නොදැති ඒ කාරණයෙනැයි දතයුතු, මේ මෙහි සංක්‍ෂෙපය විස්තරවශයෙන් වනාහි විශුද්ධිමාර්ගයෙන් බලාදතයුතුයි—මෙතෙකින් අනූනාධිකතො යන්නෙහි විනිශ්චය කරණලදී.

කමතො ජාති ආදීනං යන්නෙහි කුමක්හෙයින් ක්‍රමයෙන් දෙසනලද්දේදයත්? ජාත්‍යාදීන්ගේ දුක්ඛභාවය සර්වසත්වයන්ට සාධාරණ බැවින්ද දෙසූකල [illegible]කොට අවබොධ වන්නෝයයි

දුක්ඛසත්‍යය පළමුකොට වදාරා එයටම හේතුදක්වනු පිණිස දෙවනුව සමුදය සත්‍යයද හේතු නිරෝධයෙන් ඵලනිරෝධය වන්නේයයි දක්වනු පිණිස තුන්වෙනිව නිරෝධසත්‍යයද ඒ නිරෝධයට පමුණුවන උපාය දක්වනු පිණිස සතරවැනිව මාර්ග සත්‍යයද, වදාළහයි දතයුතුයි,

එසින් කිහං.

ඔලාරිකත්තා සබ්බ සත්ත සාධාරණත්තා ච සු විඤ්ඤෙය්‍යත්තා දුක්ඛසච්චං පඨමං වුත්තං තස්සෙව හෙතු දස්සනත්ථං තදනන්තරං සමුදයසච්චං හෙතුනිරොධා ඵලනිරොධො'ති ඤාපනත්ථං තතො නිරොධ සච්චං තදධිගමූපාය දස්ස නත්ථං අන්තෙ මග්ග සච්චං-ති.

අපිච භව සුඛාස්වාද ග්‍රථිත සත්වයන්ට හෙවත් භවය සුඛය යන ආස්වාදයෙහි ඇලුනු සත්වයන්ට සංවේගජනනය කරණු පිණිස ප්‍රථමයෙන් දුක්ඛසත්‍යය දෙසිතය දුක්ඛය අනිවර්තිත වූයේ අනිෂ්පාදිත කරණ අවී ඇත්තේ ඊශ්වරනිර්මාණාදියකින් වන්නේනොවෙයි මේ තෘෂ්ණාව නිසාම ජාත්‍යාදී දුක්ඛය වන්නේයයි දුක්ඛයට භවහෙතු දක්වන පිණිස දෙවෙනි සමුදය සත්‍යය දෙසිතය සහෙතුක දුක්ඛයෙන් අභිභූත බැවින් කලකිරුණු සිත් ඇත්තවුන්ට මෙබඳු දුකින් ගැලවීමට සුදුසු සරණක් ප්‍රතිෂ්ඨාවක් ඇද්දෝයෝයි සිතමින් සරණ සොයන්නවුන්ට සහෙතුක දුක්ඛයෙන් ගැලවෙන්ට ප්‍රතිෂ්ඨාඇති බව හඟවා ආස්වාදජනවන පිණිස නිර්වාණයෙහි ආලය උපදවන පිණිස නිරෝධ සත්‍යය තුන්වෙනිව දෙසිතය මෙසේ නිර්වාණයට පැමිණෙන්නේ මේ ආර්ය්‍ය අෂ්ටාංගික මාර්ගයෙනැයි කියා නිර්වාණාධිගමෝපාය දක්වනුපිණිස සතරවැනිව මාර්ගසත්‍යය දෙසිතයයි මෙසේ චතුරාර්ය්‍ය සත්‍යයන්ගේ ක්‍රමයෙන් විනිශ්චය වෙදිතව්‍යයි.

කියේ මැනො

භවසුඛස්සාද ගථිතානං වා සත්තානං සංවෙගජනනත්ථං පඨමං දුක්ඛමාගතං නෙව අකතං ආගච්ඡති න ඉස්සර නිම්මානාදිතො හොති ඉතො පන හොතී'ති ඤාපනත්ථං තදනන්තරං සමුදයං තතො සහෙතුකෙන දුක්ඛෙන අභිභූතත්තා සංවිග්ගමානසානං දුක්ඛ නිස්සරණ ගවෙසීනං නිස්සරණ දස්සනෙන අස්සාසජනනත්ථං නිරොධං තතො නිරොධාධිගමත්ථං නිරොධ සම්පාපකං මග්ගන්ති එවමෙත්ථ කමතො විනිච්ඡයො වෙදිතබ්බො'ති,

## ජාති ආදීනං යන්හෙති විනිශ්චය කෙසේදයත්?

යෙ තෙ අරියසච්චානි නිද්දිසන්තෙන භගවතා ජාතිපි දුක්ඛා ජරාපි දුක්ඛා * මරණම්පි දුක්ඛං සොකපරිදෙව දුක්ඛ දොමනස්සුපායාසාපි දුක්ඛා අප්පියෙහි සම්පයොගො දුක්ඛො පියෙහි විප්පයොගො දුක්ඛො යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා'ති දුක්ඛනිද්දෙසෙ ද්වාදස ධම්මායි.

දක්වනලද බැවින් යම් ඒ ආර්‍ය්‍යසත්‍යකෙණෙකුන් දෙසන් නාවූ බුදුන් විසින් ජාතිදුක්ඛය ජරාදුක්ඛය මරණදුක්ඛය සොක දුක්ඛය පරිදෙව දුක්ඛය දුක්ඛදුක්ඛය දෞර්මනස්‍ය දුක්ඛය උපායාස දුක්ඛය අප්‍රියසම්ප්‍රයොග දුක්ඛය ප්‍රිය විප්‍රයොග දුක්ඛය කැමතිදෙයක් නොලැබීම දුක්ඛය සංක්ෂෙපයෙන් පඤ්චුපාදානක්ඛන්ධ දුක්ඛයයි කියා දුක්ඛසත්‍යයෙහි ද්වාදස ධර්මකෙණෙකුන් වදාරණ ලදද.

යායං තණ්හා පොනොබ්භවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභිනන්දිනී සෙය්‍යථීදං කාම තණ්හා භවතණ්හා විභව තණ්හා'ති සමුදයනිද්දෙසෙ තිවිධා තණ්හා.

යනුහෙයින් යම් මේ තෘෂ්ණාවක්නොමෙර් පුනර්භවය කරණ සුලුවූ නන්දිරාග සංඛ්‍යාත සප්‍රීතික තෘෂ්ණාවූ ඒ ඒ ආත්මභාවයෙහි ඒ ඒ අරමුණෙහි හෝ තෘෂ්ණාවූ ස්වභාව ඇත්තේද හෝ කවරක් වන්නීද කාම තෘෂ්ණාවය භව තෘෂ්ණාවය විභව තෘෂ්ණාව යයි කියා සමුදය සත්‍යයෙහි ත්‍රිවිධතෘෂ්ණාකෙණෙකුන් වදාරණ ලදද.

යො තස්සායෙව තණ්හාය අසෙස විරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයොති එවං නිරොධ නිද්දෙසෙ අත්ථතො එකමෙව නිබ්බාණංයි.

යනුහෙයින් යම් මේ ත්‍රිවිධ තෘෂ්ණාවගේ යම් නිසෙසසයෙන් නොහැලී නැසීමෙක් ඇද්ද නිසෙසසයෙන් හැරීමෙක් ඇද්ද මිදීමෙක් ඇද්ද ආලය නොකිරීමෙක් ඇද්ද යනාමේ තෘෂ්ණාවගේ හැරීම නිරොධයයිකියා අර්ත්‍ථහෙයින් එකමනිර්වාණය වදාරණ ලදද "අයං මෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො සෙය්‍යථීදං සම්මාදිට්ඨි—පෙ—සම්මාසමාධි"යි.

යනුහෙයින් සම්‍යක්දෘෂ්ටි ආදිවූ අෂ්ටධර්ම කෙනෙකුන් මාර්ග සත්‍යයෙහි වදාරණලදද, මෙසේ චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන්ගේ නිර්දෙසයෙහි ජාති ආදිවූ ධර්මකෙණෙකුන් වදාරණලදද, ඒ ජාති

* ව්‍යාධිපි දුක්ඛො"යි. පොත්හී

ආදීන්ගේ නිශ්චයද මෙහි ලා විනිශ්චය වෙදිතව්‍යයයි යන අර්ථ
යි. ඒ කවරේද? මේ ජාති ශබ්දය වනාහි අනෙකාර්ථ ඇත්තේ
වෙයි. ඒ එසේමය එකම්පි ජාතිං ද්වෙපි ජාතියො යන තන්හි භව
යෙහි ආයේය, අත්ථි විසාඛෙ නිගණ්ඨා නාම සමණජාතියි යන
තන්හි නිකායෙහි ආයේය, ජාතිවීහි ඛන්ධෙහි සංගහිතා,යි යන
තන්හි සංඛත ලක්‍ෂණයෙහි ආයේය, යං මාතුකුච්ඡිස්මිං පඨමං
චිත්තං උප්පන්නං පඨමං විඤ්ඤාණං පාතුභූතං තදුපාදාය සාවස්ස
ජාතීයි යනතන්හි ප්‍රතිසන්ධියෙහි ආයේය, සම්පතිජාතො ආනන්ද
බොධිසත්තො යන මෙහි ප්‍රසූතියෙහි ආයේයි. අක්ඛුත්තො අනු
පකුට්ඨො ජාතිවාදෙන යන තන්හි කුලයෙහි ආයේය, ඒ මේ
ජාතිශබ්ද තෙමේ මෙහි ගර්භසෙය්‍යකයන්ගේ ප්‍රතිසන්ධියෙහි
පටන් යම්තාක් මව්කුසින් බිහිවීමක් ඇද්ද ඒ තාක් පැවති
සකන්ධයෙහි වැටෙයි යනාදීන් විනිශ්චයකාරණු, මේ ජාති තොමෝ
කවර කාරණයකින් දුක්වන්නීදයත්? අනෙක දුක්ඛයට වස්තුවූ
හෙයිනි, ඒ කවරේද දුක්ඛ දුක්ඛය විපරිණාම දුක්ඛය සංසාර
දුක්ඛය ප්‍රතිච්ඡන්න දුඃඛය අප්‍රතිච්ඡන්න දුඃඛය පර්‍ය්‍යාය දුඃඛය
නිෂ්පර්‍ය්‍යාය දුඃඛයයි කියා එහි කායික චෛතසික. දුඃඛයො
වෙදනා වශයෙන්ද ස්වභාව වශයෙන්ද නාම වශයෙන්ද දුක්වූ
හෙයින් දුඃඛ දුඃඛයයි කියනු ලැබෙත්. සුඛවේදනාවෙත්ද විප
රිණාමයෙහි දුඃඛොත්පත්තියට හේතුවන බැවින් විපරිණාම
දුඃඛ නම්වේ, උපෙක්‍ෂා වෙදනාවද අවශෙෂ ත්‍රෛභූමික සංස්කා
රයෝද උදයව්‍යය පීඩිතවනබැවින් සංස්කාරදුක්ඛ නම්වේ. කණ්
සූලය දන්තසූල රාගජ පරිලාහ ද්වෙෂජපරිලාහාදී කායික චෛ
තසික දුක්ඛය තෙමේ විචාරා දතගතයුතු බැවින්ද උපක්‍රමයටද
අප්‍රකටවන බැවින්ද ප්‍රතිච්ඡන්න දුක්ඛනම්වේ. ද්වාත්‍රිංස කර්මකාර
ණාදීන් සමුත්ථානවූ ආබාධය තෙමේ නොවිචාරාම දතගතයුතු
බැවින්ද උපක්‍රමයට ප්‍රකටවන බැවින්ද අප්‍රතිච්ඡන්න දුක්ඛ නම
වේ; දුක්ඛ දෙඟමීතශෙෂාපායාසසංඛ්‍යාත දුක්ඛසත්‍යයනයබා දුක්ඛ
සත්‍ය විභඞ්ගයෙහි ජාතපි දුක්ඛා යනාදීන ආගතවූ ජාත්‍යාදංසනු
සියල්ලද ඒ ඒ දුක්ඛයටවස්තු භාවයෙන් පර්‍ය්‍යාය දුක්ඛනම්වෙයි
දුක්ඛය වනාහී නිෂ්පර්‍ය්‍යාය දුක්ඛනම්වෙයි.

කීමෙස්මැනෝ. විශුද්ධිමාර්ගයෙහි

කස්මා පන සා දුක්ඛාති චෙ අනෙකෙසං දුක්ඛානං වත්ථුභාව
තො. අනෙකානිහි දුක්ඛානි සෙය්‍යථීදං දුක්ඛ දුක්ඛං විපරිණාම දු
ක්ඛං සංඛාරදුක්ඛං පටිච්ඡන්නදුක්ඛං අප්පටිච්ඡන්නදුක්ඛං පරියාය
දුක්ඛං නිප්පරියාය දුක්ඛං'ති තත්ථ කායික චෙතසිකා දුක්ඛ වෙද
නා සභාවතො නාමතො ච දුක්ඛත්තා දුක්ඛ දුක්ඛන්ති වුච්චන්ති

සුඛවෙදනා විපරිණාමෙ දුකඛුපපතති හෙතුතො විපරිණාම දුකඛං උපෙකඛාවෙදනා චෙව අවසෙසාච තෙභූමිකා සංඛාරා උදයබබය පරිපීළිතතතා සංඛාර දුකඛං කණණසූල දනතසූල රාගජ පරිළාහ දොසජ පරිළාහාදි කායික චෙතසිකො ආබාධො පුචඡිතවා ජානිතබබතො උපකකමසසච අපාකට භාවතො පටිචඡනන දුකඛං ද්වතතිංස කාමමකරණාදී සමුටඨානො ආබාධො අපුචඡිතවා විජානිතබබතො උපකකමසසච පාකටභාවතො අපපටිචඡනන දුකඛං ඨපෙතවා දුකඛ දුකඛං සෙසං දුකඛ සචචවිභංගෙ ආගතං ජාතාදි සබබමපි තසස තසස දුකඛසස වතථුභාවතො පරියාය දුකඛං දුකඛ දුකඛංපන නිපපරියාය දුකඛංති වුචචතීති-අපිච-මේ සත්වතෙම මවු කුස උපදිනු ලබන්නේ උත්පල පුණ්ඩරීකාදි යෙහි උපදනා කොසරු සෙයින් එහි උපදනේද නොවෙයි. ආදි ශබ්දයෙන් මුක්තා මාණික්‍යාදි රත්නයෙක උපදනේද නොවෙයි. කොතැනක උපදීදයත් ආමාශයෙන්යට පක්වාශයෙන් උපරි භාගයෙහි උදර පටලය හා පිටසිකන්ටක දෙදෙනාගේ මධ්‍යයෙහි පරම සම්බාධවූ බොල්වූ ඇඳිරි ඇති පිත්සෙම් පූයා රුධිර පැසුනු ආහර නොපැසුනු ආහර යනාදි නානාප්‍රකාර කුණප ගන්ධයෙන් පරිභාවිතවූ අතිශයින් දුර්ගන්ධවූ පවතින් හැසිරෙණ ලද අතිමාත්‍රවූ ජිගුප්ෂා මාතෘ කුක්ෂි ප්‍රදේශයෙහි පූතිමත්ස්‍ය පූතිකුල්මාසස්‍ය චන්දනිකායෙහි ක්‍රිමියක්හු මෙන් උපදනේය එසේ උපන් තැනැත්තෝ දසමාසයක් දවස් මව්කුස්හි සමහවීමෙන් පත්‍රපුටයෙහි හුයන බෙහෙදක් සෙයින්ද පිටිපිඩෙක් සෙයින් දනුලබන්නේ යටිහකෙකහි තබනලද සංකුචිතවූ හස්තචය ඇතිව උක්කුටුකයෙන් හිඳිනා බැවින් ආකුචන ප්‍රසාරණාදි රහිතවූ අතිමාත්‍ර දුක්ඛයක් අනුභව කෙරෙයි මේ ගර්භාවක්‍රාන්ති මූලක දුක්ඛනම් වේ,

### එයින් කීහ විශුද්ධිමාර්ගයෙහි;

අයංහිසතතො මාතුකුචඡිමහි නිබබතතමානො න උපපල පදුම පුණඩරීකාදීසු නිබබතතති අථඛො හෙඨා ආමාසයසස උපරිපකකාසයසස උදර පටල පිඨිකණටකානං වෙමජෙඣ පරම සමබාධෙ තිබබනධකාරෙ නානා කුණප ගනධ පරිභාවිත පරම දුගගනධපවන විචරිතෙ අධිමතත ජෙගුචෙඡ කුචඡිපපදෙසෙ පූති මචඡ පූතිකුමමාස චනදනිකාසු කිමිවිය නිබබතතති සො තතථ නිබබතෙතා දසමාසෙ මාතුකුචඡිසමභවෙන උස්මනා පුටපාකං විය පචචමානො පිටඨපිණඩිවිය සෙදියමානො සමමිඤජන පසාරණාදි රහිතො අධිමතතං දුකඛං පචචනුභොතීති ඉදං තාව ගබභොකකනති මූලකං දුකඛංති,

සම්බන්ධවූ බහු මච්ඡතොමෝ වහා පැකිලෙන ගමන නිසීදන ව්‍යුත්ථාන පරිවර්තනාදී අපේක්ෂාහරණ කාලයෙහි සුරාධූර්ත හස්ත ගත දික්ලොම් ඇති එළුවෙකුමෙන්ද අහිගුණ්ඨික හස්තගතසර්ප පොතකයෙකු මෙන්ද තමහට අභිමුඛ කොට ඇදීම් වශයෙන් ආකර්ෂණ විසින්ද හාත්පසින් ඔබ්බනොබ අත් දමීමෙන් පරිකර්ෂණ විසින්ද අධොමුඛ කොට චලනය කිරීමෙන් අවධූනන විසින්ද උඞ්ඩ මුඛ කොට චලනය කිරීමෙන් නිධූනන විසින් දූෂියනාදීන් විසින් උපක්‍රමයෙන් අතිමාත්‍රවූ දුඃඛානුභව කෙරෙයි මව සීතොදකපාන කාලයෙහි තරුණ ව්‍රණසදෘශවූ ඉතා සිවුමැලිවූ ගර්භගත ශරීරය සවල්පවූ සීතාදියක් සමනොවන බැවින් සීත නරකයෙහි උපන්නාක් සෙයින් උෂ්ණවූ යාගු බත් ආදිය අපේක්ෂා හරණ කාලයෙහි අඟාර වර්ෂායෙන් වටකරණලද් දක්හු සෙයින් ලුණු ඇඹුල් අපේක්ෂාහරණ කාලයෙහි සැතින් කොදිගෙලා ලුණු ඇඹුල් ගල්වා කරණ ඛාරාපතච්ඡිකාදි කර්ම කරණ ප්‍රාප්තයක්හු මෙන් තිව්‍රවූ බොල්වූ දුක්ඛානුභව කෙරෙයි මේ ගර්භ පරිහරණ මූලක දුක්ඛනම්වේ.

### කිශේමැනෝ

යං පන සො මාතු සහසා උපක්ඛලන ගමන නිසීදන වුට්ඨාන පරිවත්තනාදිසු සුරාධුත්ත හත්ථගතො එලකොවිය අහිගුණ්ඨික හත්ථගතො සප්පපොතකො විය ව ආකඩ්ඪන පරිකඩ්ඪන ඔධූනන නිධූනනාදි උපක්කමෙන අධිමත්තං දුක්ඛමනුභවති යඤ්ච මාතු සීතුදකපාන කාලෙ සීතනරකූපපන්නො විය උණ්හයාගු භත්තාදීනි අජ්ඣොහරණ කාලෙ අඞ්ගාරවුට්ඨි සම්පරිකිණ්ණො විය ලොණම්බිලාදී අජ්ඣොහරණ කාලෙ ඛාරාපතච්ඡිකාදි කම්ම කාරණප්පත්තො විය තිබ්බං දුක්ඛමනුභොති ඉදං ගබ්භ පරිහරණ මූලකං දුක්ඛංසි–සත්ව යාහට මූඪගර්භයයි කියනලද සරස්වූ ගර්භ ඇති මාතෘවගේ මිත්‍රා මාත්‍ය සුහෘජ්ජනයන් විසිනුදු අදශීනීයවූ දුක්ඛොත්පත්ති ස්ථානයෙහි ඡෙදනඵාලනාදී විසින් යම් දුක්ඛයක් විඳිනා ලබනු ලද්දීද මේ ගර්භ විපත්තිමූලක දුක්නම්වේ.

### එසිණ් කිහ.

යම්පන සස මූල්හ ගබ්භාය මාතුයා මිත්තා මච්චසුහජ්ජාදීහිපි අදස්සනාරහෙ දුක්ඛුප්පත්තිඨානෙ ඡෙදන ඵාලනාදීහි දුක්ඛං උප්පජ්ජති ඉදං ගබ්භ විපත්තිමූලකං දුක්ඛං”සී. විජායමාන මාතෘ සඞ්ඛ්‍යාත වදන්නාවූ මාතෘවගේ කර්මජවාතයන් විසින් උඞ්ඩම පාදව අධඃශිරොභාවයෙන් පෙරලා නරක ප්‍රපාතයක්

බඳු අතිභයානක යොනිමාර්ගයට පිළිපන්නු ලබන්නහුගේ ගෙවත් ප්‍රතිපාද්‍යමාන සත්‍වයාහට රමසාම්බාධවූ යොනිමුඛයෙන් තාලච්ඡිග්ගලය කුම්භාච්ඡිද්‍රයයි කියනලද කෙසි සිදුරකින් නික්මෙන්නාවූ ඇතෙකුටමෙන් සංඝාත පර්වතයෙන් විචූර්ණණියමාන නිරිසතක්හටමෙන් යම් දුකක් උපදීද මේ විජායනමූලක දුක්ඛ නම්වේ.

## එසින් කිහ.

යං විජායමානාය මාතුයා කම්ම ජෙහි වාතෙහි පරිවත්තෙත්වා නරකප්පපාතකං විය අතිභයානකං යොනිමග්ගං පටිපාතියමානස්ස පරම සම්බාධෙන යොනිමුඛෙන තාලච්ඡිග්ගලෙන විය නික්කඩ්ඪියමානස්ස මහානාගස්ස නරක සත්තස්ස විය ච සංඝාත පබ්බතෙහි විචුණ්ණියමානස්ස දුක්ඛං උප්පජ්ජති ඉදං විජායන මූලකං දුක්ඛංති.

ජාත සත්‍වයාහට අලුත් වණයක් වැනි ශරිරඇත්තාහට අත් ගැසීමෙහි හෙවත් ඇලවීමෙහි නැහැවීමෙහි ධොවනයෙහි රෙදිකඩින් පරිමර්දනාදියෙහි හිඳිකටුතුඩින් පිඳිනා බඳුව කර මුව හතින් පලන බඳුව යම් දුක්ඛයක් උපදීද මේ ගර්භයෙන් බහිනිස්ක්‍රමණ මූලක දුක්ඛ නම්වේ.

## එසින් කිහ.

යං චාපන ජාතස්ස තරුණවණ සදිසස්ස සුකුමාර සරීරස්ස හත්ථගහණනහාපන ධොවන චොළ පරිමජ්ජනාදි කාලෙ සූචිමුඛ ඛුර ධාරවිජ්ජන ඵාලන සදිසං දුක්ඛං උප්පජ්ජති ඉදං මාතු කුච්ඡිතො බහිනික්ඛමණ මූලකං දුක්ඛං–යි.

එසින් මෙතනහි ප්‍රවෘත්තිය තමාම තමහට වධකාරනුවහට අචෙලකව්‍රතාදී වශයෙන් ආතාපනයයි කියනලද හිරබලාසිටීම් ආදී විසින් විශෙෂයෙන් තැවීමය පරිතාපනයයි කියනලද පච තාපනයෙන් හාත්පසින් තැවීමය යන මේ අනුයොගයෙහි යුක්තයහට ක්‍රොධ වශයෙන් අභුජමානයහට රජ්ජු විසින් උද්බන්ධ්‍යමානයහට යම් දුකෙක් උපදීද මේ ආත්මොපක්‍රම මූලක දුක්ඛය නම්වේ.

## එසින් කිහ.

යං තතොපරං පවත්තියං අත්තනාව අත්තානං වධෙන්තස්ස අචෙලක වතාදි වසෙන ආතාපන පරිතාපනානුයොග මනුයුත්තස්ස කොධ වසෙන අභුඤ්ජන්තස්ස උබ්බන්ධන්තස්සච දුක්ඛං හොති ඉදං අත්තුපක්කම මූලකං දුක්ඛං–යි.

අනුන් කෙරෙන් වධබන්ධනාදීන් අනුභව කරන්නාහට යම් දුක්ඛයෙක් උපදීද මේ පරොපක්‍රමමූලක දුක්ඛය ගර්භපරිහරණ මූලක දුක්ඛය ගර්භවිපත්ති මූලක දුක්ඛය විජායන මූලක දුක්ඛය ගර්භයෙන් බහිනිෂ්ක්‍රමණ මූලක දුක්ඛය ආත්මොපක්‍රම මූලක දුක්ඛය පරොපක්‍රම මූලක දුක්ඛය යන මේ ආදී අනෙක දුක්ඛයන්ට මූල්වන හෙයින් ජාති දුක්ඛ නම්වේ, ජරා දුක්ඛය නම් කවරයත්? ජරායෙන් ජීර්ණයාගේ අත්බැව ජරපත්සකටයක් සෙයින් බලරහිතවෙයි, ඉඳීම් සිටීම් සක්මන් කිරීම් උදෙසා උත්සාහකරන්නාහටද බලවත්වූ කායදුක්ඛයෝ උපදිත් යම් කාරණයකින් ළදරු කාලයෙහි සූක්ෂ්මවූ සකවිෂය සුවයෙන් ගන්නට පොහොසත්වූ චක්ෂුරාදි ඉන්ද්‍රියයෝ ජරාප්‍රාප්තයහට පරිපක්ව අලුලිත අවිසදවූයේ ඖදරිකවූ සකවිෂය ග්‍රහණයට අසමර්ථවේද ඒ කාරණයෙන් පුත්‍රදාරාවන් පූජියෙහිමෙන් රක්ෂා කරන්නට අසමර්ථ වන්නාහට පුත්‍රදාරාවන් විසින් අවඥකරණ බවට නිසිවන බැව්නුදු දුඃඛදෞර්මනස්‍ය උපද්දී මෙසෙයින් අඞ්ග ප්‍රත්‍යඞ්ග ශෛථිල්‍ය ඉන්ද්‍රිය විකාරවිරූපතා යෞවන විනාශය වීර්යහානි සමෘති විප්‍රවාස පරිභවාදි අනෙකප්‍රකාරවූ කායික චෛතසික දුක්ඛ උපද්දී ජරාව ඒයටම වස්තුවේ.

එසින් කිහං.

අඞ්ගානං සිථිලීභාවා ඉන්ද්‍රියානං විකාරතො
යොබ්බනස්ස විනාසෙන බලස්ස උපඝාතතො,
විප්පවාසා සතාදීනං පුත්තදාරෙහි අත්තනො
අපසාදනියතො චෙව භීය්‍යො බාලත්ත පත්තියා.

පප්පොති දුක්ඛං යංමච්චො කායිකං මානසං තථා
සබ්බමෙ තං ජරාහෙතු යස්මා තස්මා ජරා දුඛා—යි.

මෙසෙයින් ජරාදුක්ඛය දතයුතුයි. ජරා මතු දුක් නොවෙයි මරණයද දුක්වන්නේය මරණය නම් කිමයත්?

යං තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්ත නිකායා චුතිචවනතා භෙදො අන්තරධානං මච්චු මරණං කාල කිරියා ඛන්ධානං භෙදො කලෙබරස්ස නික්ඛෙපො ඉදං වුච්චති භික්ඛවෙ මරණං—යි.

යනුවෙන් වදාරණලද්දේ මරණය නම්වේ, මෙසෙයින් දක්වනලද මරණය කවරහෙයකින් දුක්වියයත්? කායික දුක්ඛයන්ට වස්තුවූහෙයින් දුක්ඛ නම්වේ.

## එයින් කීහ.

පාපස්ස පාප කම්මාදි නිමිත්ත මනුපස්සතො
භද්දස්සා පස හන්තස්ස වියොගං පියවත්ථුකං.
මීයමානස්ස යං දුක්ඛං මානසං අවිසෙසතො
සබ්බෙ සංචාපියං සන්ධිබන්ධනච්ඡෙදනාදිකං.
විතුජ්ජමානධම්මානං හොති දුක්ඛං සරීරජං
අසය්හ මප්පතීකාරං දුක්ඛසෙස තස්සිදං යතො
මරණං වත්ථු තෙනෙතං දුක්ඛ මිච්චෙව භාසිතං—යි.

මේ මරණ දුක්ඛයෙහි විනිශ්චයයි. සොක දුක්ඛය කෙසේදයත්?

කතමො ච භික්ඛවෙ සොකො යො ඛො භික්ඛවෙ අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස සොකො සොචනා සොචිතත්තං අන්තො සොකො අන්තො පරිසොකො අයං වුච්චති භික්ඛවෙ සොකො—යි.

යනුවෙන් වදාරණලද්දේ සොකය නම්වේ, සොකය කුමක් හෙයින් දුක්විදයත්? සොකය නම් ඥාතිව්‍යසනාදියෙන් සත්වයන්ගේ හෘදයට වැද විසසල්ලයක් සෙයින් විසපෙවුහුලක් සෙයින් හෘදය විදිසි නැවත භූසංප්‍රාප්ත තප්ත නාරාච හෙයින් හෘදය දවයි යම්කරුණෙන් ව්‍යාධි ජරා මරණාදී ප්‍රභෙද ඇති නෙකවිධ දුක්ඛය එලවාද, කිසේදයත්? දුබ්ලවූද සොකයෙන් වහා ජරාවට පැමිණෙන බැවින් සොකයම ජරාවද එළවයි බලවත් සොකයෙන් අතීසාරාදි ව්‍යාධි වන බැවින් සොකයම ව්‍යාධියද එළවයි වෛපුල්‍යප්‍රාප්ත සොකයෙන් ළයපැලී මියන බැවින් සොකයම මරණුදු එළවන්නේවේද ඒ කාරණයෙන් සොකය දුක්ඛය නම්වේ.

## එයින් කීහ.

සත්තානං හදයං සොකො විස සල්ලංව තුජ්ජති
අග්ගි තත්තොව නාරාචො භුසංච ඩහතෙපුන
සමාවහතිච ව්‍යාධි ජරා මරණ භෙදනං
දුක්ඛමපි විවිධං යස්මා තස්මා දුක්ඛොති වුච්චති.

මේ සොක දුක්ඛයෙහි විනිශ්චයයි. පරිදෙවය කෙසේදයත්?

යො ඛො භික්ඛවෙ අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛ ධම්මෙන ඵුට්ඨස්ස

ආදෙවො පරිදෙවො ආදෙවිතත්තං පරිදෙවිතත්තං ආදෙවනා පරිදෙවනා අයං වුච්චති භික්ඛවෙ පරිදෙවො-සි.

යනුවෙන් වදාරණලද්දේ පරිදෙව නම්වේ,පරිදෙවය කුමක් හෙයින් දුක්විදයත්? සොක නැමති විෂපීත සල්ලයෙන් විහතව හඬනුලබන්නාවූ සත්වතෙමේ යම්හෙයකින් කට දනනාවරණ උගුරු වියලීම් වශයෙන් නොඉවසිය හැකිවූ අතිමාත්‍රවූ යම් දුක්ඛයකට පැමිණේද ඒ කාරණයෙන් පරිදෙවය දුක්ඛයයි කියා බුදුන් විසින් වදාරණලදී,

එසින් කිහ.

යං සොක සල්ල විහතො පරිදෙවමානො
කණ්ඨොෂ්ඨ තාලුතලසොසජමප්පසය්හං
භිය්‍යොධි මත්ත මධිගච්ඡති යෙව දුක්ඛං
දුක්ඛන්ති තෙන භගවා පරිදෙවමාහ–සි.

මේපරිදෙවදුක්ඛයෙහි විනිශ්වයයි. දුක්ඛ දුක්ඛය නම් කවරහයත්?

කතමඤ්ච භික්ඛවෙ දුක්ඛං යංඛො භික්ඛවෙ කායිකං දුක්ඛං අසාතං කාය සම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛං—සි.

යනුවෙන් මහාසතිපට්ඨානයෙහි වදාරණලද්දේ දුක්ඛය නම් වේ, හේ කුමට දුක්විදයත්?දුක්ඛය නම් කායිකදුක්ඛය ඒකායිකා දුක්ඛය පීලනයකිරීම ලක්‍ෂණකොට ඇත්තේය දුෂ්ප්‍රාඥයන්ට දෞර්මනස්‍ය උපදවන බව කෘත්‍යයකොට ඇත්තේය. කායිකා බාධය ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තේය දුක්ඛයවනාහි දුක්ඛ දුක්ඛයහෙයින්ද සිතට දුක්එළවන හෙයින්ද දුක්ඛ නම්වේ.

එසින් කිහ.

දුක්ඛං නාම කායිකං දුක්ඛං තං කායපීලන ලක්ඛණං දුප්පඤ්ඤානං දොමනස්සකරණරසං කායිකාබාධපච්චුපට්ඨානං දුක්ඛං පන දුක්ඛ දුක්ඛතො මානසං දුක්ඛාවහනතො ච–සි.

ව්‍යාපාද සම්ප්‍රයොගයෙන් රහතුන් අනාගැමියන් බොධිසත්වයන්ට කායිකවේදනාව සිත්හි දොම්නස් ඉපදවිය නොහෙනබැවින් "දුප්පඤ්ඤානං දොමනස්සකරණං"යි කීහයි සෙත්. මේ දුක්ඛයෙහි විනිශ්වයයි. දෞර්මනස්‍යය කෙසේදයත්?

කතමඤ්ච භික්ඛවෙ දොමනස්සං යං ඛො භික්ඛවෙ චෙතසිකං අසාතං මනොසම්ඵස්සජං දුක්ඛං අසාතං වෙදයිතං ඉදං වුච්චති භික්ඛවෙ දොමනස්සං—සි.

යනුවෙන් වදාරණලද්දේ දෞර්මනස්‍යය නම්වේ. හේ කුමකින් දුක්වීදයත්? දෞර්මනස්‍යය නම් සිතට දුක් එළවින්නේය ඒ දෞර්මනස්‍යය සිතට පීඩාකිරීම ලක්‍ෂණකොට ඇත්තේය සිත්හු වෙහෙස කෘත්‍යයකොට ඇත්තේය සිතට ව්‍යාධි එළවන බව ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තේය දුක්ඛය වනාහි දුක්ඛ දුක්ඛය හෙයින්ද කායිකදුක්ඛය එළවනහෙයින්ද චෛතසිකදුක්ඛයෙන් සමන්විතවූයේ හිසකෙස් වනා හඬති ලෙහි අත් සපති ඇඹරෙති ආවර්තනය වෙති පෙරළෙති ඌර්ධ්වපාදව හෙති තමාගේ ශරීරය ඇනගැන්මෙන් කොටාගැන්මෙන් ශස්ත්‍ර එළවති නැසෙනු පිණිස විසකති රජ්ජුයෙන් උද්බන්ධනය කෙරෙති ගින්නට ප්‍රවිෂ්ටවෙති නානාප්‍රකාර දුක් අනුභව කෙරෙතියි යනු දක්වන්නට කිහ.

දොමනස්සං නාම මානසිකං දුක්ඛං තං චිත්තපීළනලක්ඛණං මනො විඝාතරසං මානසං ව්‍යාධිපච්චුපට්ඨානං දුක්ඛ පන දුක්ඛ දුක්ඛතො කායිකදුක්ඛා වහනතො ච චෙතොදුක්ඛසමප්පිතා හි කෙසෙපකිරිය කන්දන්ති උරානි පතිපිංසෙන්ති ආවට්ටන්ති විවට්ටන්ති උඩ්ඪපාදං පතන්ති සත්ථං ආහරන්ති විසං ඛාදන්ති රජ්ජුයා උබ්බන්ධන්ති අග්ගිං පවිසන්තීති නානප්පකාරං දුක්ඛං අනුභවන්ති —යි.

මේ දෞර්මනස්‍යයෙහි විනිශ්චයයි. උපායාසය කෙසේදයත්?

කතමො ච භික්ඛවෙ උපායාසො යො ඛො භික්ඛවෙ අඤ්ඤතරඤ්ඤතරෙන ව්‍යසනෙන සමන්නාගතස්ස අඤ්ඤතරඤ්ඤතරෙන දුක්ඛධම්මෙන ඵුට්ඨස්ස ආයාසො උපායාසො ආයාසිතත්තං උපායාසිතත්තං අයං වුච්චති භික්ඛවෙ උපායාසො-යි.

යනුවෙන් වදාරණලද්දේ උපායාසනම් ඒ කුමකින් දුක්වීදයත්, උපායාසනම් ඥාතිව්‍යසනාදීන් පහරණු ලබන්නාහට අධිමාත්‍රවූ චිත්ත දුක්ඛයෙන් උපයනලද ද්වේෂසංඛ්‍යාත ප්‍රතිඝයම ‘භූසමාදාන උපාදානං, යනුවෙන් "භුසො ආයාසො" යනාදීන් දක්වනලද ඒ උපායාසය තෙමේ සිතදහනය කිරීම ලක්‍ෂණකොට ඇත්තේය. නත්ථනබව කෘත්‍යය කොට ඇත්තේය විෂාද බව ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තේය හෙතෙම චිත්තපරිදහනා දීග වන බැවින් දුක්ඛනම්වේ දක්වනලදමැයි.

චිත්තස්ස පරිදහනා කායස්ස විසාදනා ච අධිමත්තං
යං දුක්ඛමුපායාසො ජනෙති දුක්ඛො තතො වුත්තො-යි,

මේ උපායාසයෙහි විනිශ්චයයි. අප්‍රිය සම්ප්‍රයොගය නම් කෙසේදයත්? අප්‍රියසම්ප්‍රයොගයනම් අමනාප සත්ත්වසංස්කාරයන් හා සමග සමොධානය හෙවත් එක්වීමය ගේ අනිෂ්ට සමොධානය ලක්‍ෂණ කොට ඇත්තේය චිත්තවිඝාතය කෘත්‍යයකොට ඇත්තේය අනර්ථ භාවය වැටහීම්කොට ඇත්තේය දුක්ඛයට වස්තුබැවින් දුක්ඛය නම් වෙයි.

එයින් කීහ.

දිස්වාච අප්පියෙ දුක්ඛං පඨමං හොති චෙතසි
තදූපක්කම සම්භූත මථ කායෙ යතො ඉධ
තතො දුක්ඛච යස්සාපි වදන්තො සො මහෙසිනා
දුක්ඛො වුත්තොති විඤ්ඤෙය්‍යො අප්පියෙහි සමාගමො-යි

මේ අප්‍රිය සම්ප්‍රයොගයෙහි විනිශ්චයයි. ප්‍රිය විප්‍රයොගය නම් කිමයත්? ප්‍රිය විප්‍රයොගය නම් මනාප සත්ත්වසංස්කාරයන් කෙරෙන් වෙන්වනබවය හෙතෙම ඉෂ්ටවස්තුහුගේ වෙන්වීම ලක්‍ෂණකොට ඇත්තේය සොකොත්පාදන රසකොට ඇත්තේය ව්‍යසනය ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තේය සොක දුක්ඛයට වස්තුවූ හෙයින් හෙද දුක්ඛ නම්වේ,

එයින් කීහ.

ඤාතිධනාදිවියොගා සොකසරසමප්පිතා විතුජ්ජන්ති
බාලායතො තතොයං දුක්ඛොති මතො පියවියොගො-යි.

මේ ප්‍රිය විප්‍රයොගයෙහි විනිශ්චයයි, යම් කැමති දෙයක් නොලැබීම කෙසේදයත්? මෙහි වනාහි,

කතමච භික්ඛවෙ යම්පිච්ඡං නලභති තම්පිදුක්ඛං ජාතිධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න ජාති ධම්මා අස්සාම නච වත නො ජාති ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පි දුක්ඛං ජරාධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහෝ වත මයං න ජරාධම්මා අස්සාම නච වත නො ජරා ආගච්ඡෙය්‍යාති නඛොපනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං. ව්‍යාධිධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වතමයං න ව්‍යාධි ධම්මා අස්සාම නච වත නො ව්‍යාධිආගච්ඡෙය්‍යාති නඛොපනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං නලභති තම්පිදුක්ඛං මරණධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡාඋප්පජ්ජති අහො වත මයං න

මරණධම්මා අස්සාම නච වත නො මරණං ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සොකධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න සොකධම්මා අස්සාම නච වත නො සොකො ආගච්ඡෙය්‍යාති-පෙ-දුක්ඛං පරිදෙවධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න පරිදෙවධම්මා අස්සාම නච වත නො පරිදෙවො ආගච්ඡෙය්‍යාති-පෙ-දුක්ඛං දුක්ඛධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න දුක්ඛධම්මා අස්සාම නච වත නො දුක්ඛං ආගච්ඡෙය්‍යාති -පෙ-දුක්ඛදෙමනස්සධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න දෙමනස්සධම්මා අස්සාම නච වත දෙමනස්සං ආගච්ඡෙය්‍යාති-පෙ-දුක්ඛං උපායාසධම්මානං භික්ඛවෙ සත්තානං එවං ඉච්ඡා උප්පජ්ජති අහො වත මයං න උපායාසධම්මා අස්සාම නච වත නො උපායාසො ආගච්ඡෙය්‍යාති න ඛො පනෙතං ඉච්ඡාය පත්තබ්බං ඉදම්පි යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං.

යනුවෙන් වදාරණලද්දේ යම් කැමති දෙයක් නොලැබීම යන්නෙහි විභාගයයි හෙද අලභ්‍යමාන වස්තුහුගේ කැමතිවීම ලක්‍ෂණකොට ඇත්තේය ඒ අලභ්‍යමානවස්තුව පය්‍යෙෂණය කිරීම කෘත්‍යය කොට ඇත්තේය. ඔවුන්ගේ අසම්ප්‍රාප්තවීම ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තේය දුක්ඛයටවස්තුහෙයින් හෙද දුක්නම්වේ,

එයින් කීහ.

තං තං පත්ථය මානානං තස්ස තස්ස අලාභතො
යං විඝාතමයං දුක්ඛං සත්තානං ඉධ ජායති
අලබ්භනෙය්‍ය වත්ථූනං පත්ථනා තස්ස කාරණං
යස්මා තස්මා ජිනො දුක්ඛං ඉච්ඡිතා ලාභමබ්‍රවි–යි.

මේ ඉච්ඡිතාලාභයෙහි විනිශ්චයයි. සංක්‍ෂෙපයෙන් පඤ්චුපාදානක්ඛන්ධදුක්ඛය කෙසේදයත්? මේසත්‍යනිර්දෙශයෙහි ජාතිප්‍රභෘත කොට යම් දුක්ඛයෙක් කියනලද්දේද දුක්ඛක්ඛන්ධ පාලිය පණ්ඩිත සූත්‍රාදියෙහි ඒකියනලදද මෙහි ස්වරූපයෙන් නොකියනලදදයම් දුක්ඛයෙක්ඇද්ද ඒසියලු දුක්ඛයමඋපාදානස්කන්ධයන් හැර නොලැබෙයි යම්කාරණයෙකින් සංක්‍ෂෙපයෙන් උපාදානස්කන්ධයන් කෙරෙන් මේ දුක්ඛයො වෙද්ද ඒ කාරණයෙන් දුක්ඛසත්‍යය දෙශනාකරණ බුදුන් විසින් උපාදානස්කන්ධයයි වදාරණලද්දේ යයි යනු දක්වන්නට කීහ.

ජාතිප්පභූතිං දුක්ඛං යං වුත්තමිද තාදිනා
අවුත්තං යච තං සබ්බං විනා එතෙ න විජ්ජති
යස්මා තස්මා උපාදානක්ඛන්ධා සංඛෙපතො ඉධ
දුක්ඛාති වුත්තා දුක්ඛන්ත දෙසකෙන මහෙසිනා–ති.

මෙහි සචස්කන්ධය නම්

භූතප්පසාදවිසයා භාවො හදයමිච්චපි
ජීවිතාහාරරූපෙහි අට්ඨාරස විධං තථාති.

යනුහෙයින් සන්බද්ධලක්ෂණවූ පෘථිවිධාතුය ද්‍රවලක්ෂණවූ අප්ධාතුය උෂ්ණත්ව ලක්ෂණවූ තෙජෝධාතුය චලනලක්ෂණවූ වායෝධාතුය යන භූතරූපය රූපදර්ශනයට කාරණාවූ චක්ෂුඃප්‍රසාදය ශබ්දශ්‍රවණයට කාරණාවූ ශ්‍රොත්‍රප්‍රසාදය ගන්ධඝ්‍රාණයට කාරණාවූ ඝ්‍රාණප්‍රසාදය රසාස්වාදයට කාරණාවූ ජිහ්වාප්‍රසාදය ස්පර්ශග්‍රහණයට කාරණවූ කායප්‍රසාදය යන ප්‍රසාදරූපය. චක්ෂුවට ගොචරවූ රූපාලම්බනය ශ්‍රොත්‍රයට ගොචරවූ ශබ්දාලම්බනය ඝ්‍රාණයට විෂයවූ ගන්ධාලම්බනය ජිව්හාවට විෂයවූ රසාලම්බනය කායෙන්ද්‍රියට විෂයවූ ස්පර්ශාලම්බනය යන විෂයරූපයෝය. ස්ත්‍රීභාවය පුරුෂභාවය මනොධාතු මනොවිඥ්ඥාණ ධාතූන්ට ආධාරවූ හෘදයවස්තුවය දෙහස්ථිතියට කාරණාවූ රූපජීවිතෙන්ද්‍රියය ශරීරය පවත්නාවූ ඕජාරූපය යන මේ අටළොස් වැදෑරුම්වූ රූපයෝ රූපස්කන්ධය නම් වේ ඉෂ්ටානුභවනලක්ෂණවූ සුඛවෙදනාවය අනිෂ්ටානුභවනලක්ෂණවූ දුක්ඛ වෙදනාවය මධ්‍යස්ථානුභවන ලක්ෂණවූ උපෙක්ෂා වෙදනාවය යන වෙදනාත්‍රය වෙදනා ස්කන්ධයනම්වේ. රූපාදී අරමුණු ඇඳිනගැන්ම ස්වභාව කොටඇති සංඥාව සංඥා ස්කන්ධනම්වේ.

සංඛාරො චෙතනා ඵස්සො මනක්කාරො සුඛනයීති
තක්කො චාරො ච වායාමො පීතිච්ඡන්දාධි මොක්ඛතා
සද්ධාසතිහිරොත්තප්පං චාගො මෙත්තාමතී පුන
මජ්ඣත්තතා ච පස්සද්ධි කායචිත්තවසා දුවෙ.

"ලහුතා මුදුකම්මඤ්ඤ පාගුඤ්ඤමුජ්ජුතා තථා
දයාමුදා මිච්ඡවාච කම්මන්තා ජීවසංවරො
ලොභො දොසො ච මොහො ච දිට්ඨි උද්ධච්චමෙව ච
අහිරිකා මනොත්තප්පං විචිකිච්ඡිත මෙ'වච.

මානො ඉස්සා ච මච්ඡෙරා ච කුක්කුච්චං ථීනමිද්ධකං
ඉති එතානි පඤ්ඤාස සංඛාරක්ඛන්ධ සඤ්ඤිතා.

යනුහෙයින් සංස්කාරයචෙතනාවය ස්පර්ශය මනස්කාරය අරූපජීවිතෙන්ද්‍රියය එකාග්‍රතාවය විතර්කය විචාරය වීර්‍ය්‍යය ප්‍රීතිය ඡන්දය අධිමොක්ඛය ශ්‍රද්ධාවය සමෘතිය හිරිය ඔත්තප්පය අලොභය අද්වෙෂය අමොහය තත්‍රමධ්‍යස්ථතාවය කායපස්සද්ධි චිත්ත පස්සද්ධි දෙදෙනය කායලහුතා චිත්ත ලහුතා දෙදෙනය කාය මෘදුතා චිත්තමෘදුතා දෙදෙනය කායකම්මඤ්ඤතා චිත්ත කම්ම ඤ්ඤතා දෙදෙනය කායප්‍රගුණ්‍යතා චිත්තප්‍රගුණ්‍යතා දෙදෙනය කායඍජුතා චිත්තඍජුතා දෙදෙනය කරුණාවය මුදිතාවය සම්‍යක්වාචාය සම්‍යක් කර්මාන්තය සම්‍යක් ආජීවය ලොභය ද්වෙෂය මොහය මිථ්‍යාදෘෂ්ටිය ඖද්ධත්‍යය අහිරිකය අනොත්ත ප්පය මානය ඊර්ෂ්‍යාවය මාත්සර්‍ය්‍යය පශ්චාත්තාපය ථීනය මිද්ධය යන මේ පණස් චෛතසික ධර්මයො සංස්කාරස්කන්ධ නම්වේ. විෂයවිජානන ලක්‍ෂණයෙන් එකවිධවූ කුසලාකුසල අව්‍යාකෘත වශයෙන් ත්‍රිවිධවූ කාමාවචර රූපාවචර අරූපාවචර ලොකො ත්තර වශයෙන් චතුර්විධවූ චෙදනා ඥාන සංස්කාරාදි භෙද යෙන් එකුන් අනූවක් පමණැතිචිත්තය විඥානස්කන්ධ නම්වේ මෙපචස්කන්ධයෙහි.

ඵෙනපිණ්ඩූපමං රූපං වෙදනා බුබ්බුළූපමා,
මරීචිකූපමා සඤ්ඤා සංඛාරා කදලූපමා
මායූපමං ච විඤ්ඤාණං දෙසිතා දිච්චබන්ධුනා

යනුහෙයින් රූපස්කන්ධය පෙණපිඩකට බඳුවූ උපමා ඇත් තේය වෙදනාස්කන්ධය දියබුබුලකට බඳුවූ උපමා ඇත්තේය සංඥස්කන්ධය මහඅව්වෙහි පෙණෙන මිරිගුදියට බඳු උපමා ඇත්තේය සංස්කාරස්කන්ධය කෙහෙල්කඳකට බඳු උපමා ඇත් තේය විඤ්ඤාණස්කන්ධය ඉන්ද්‍රජාලයකට බඳුවූ උපමා ඇත්තේයි රූපස්කන්ධය පෙණපිඩක් වැනිවූයේ කෙසේද? යම්සේ පෙණ පිඩෙහි කිසි සාරත්වයක් නැත්තේද එයින් පාත්‍රයක් හෝ තලු තැටියක් හෝ විත්පලින් ආදීවූ කිසිවක් හෝ කරමහයි ඇර ගත නොහැක්කේද ගතත් එබඳු වැඩක් සිඩනොකොට බිඳීයත් තේද එමෙන් රූපස්කන්ධයද නිත්‍යයයි කියාවත් ධ්‍රැවයයි කියා වත් මමය මාගේය කියාවත් නුවණින් සිතාගත නොහැක්කේ වේ, තවද යම්සේ පෙණපිඩ සිදුරුවී නොයෙක් සත්ත්වදක්වා බොහෝ දියබරණ ඇටමැඩි කොඩයින් ආදිවූ නොයෙක් ප්‍රාණීන් ලගිනාතැන්වේද එපරිද්දෙන්ම රූපස්කන්ධය මුඛනාසි කාදි කුඩාමහත් සිදුරුහා නොයෙක් ඇට නහර සන්ධි ගැලවි ත්තකොටකය ගණ්ඩූපපාදය තාලහිරකය සූචි මුඛය පටතන්තු

සූප්‍රාශ් යනාදීවූ අසූකුලයක පණුවන්ට ලඟිනා ගේත්වේද
දරූ වදනා ගේත්වේද වැසිකිළියත් වේද නානගෙයත්
වේද ගිලානගෙයත් වේද සුසානයත්වේද යම්සේ පෙණ පිඬක්
ආදියෙන් දෙබරගෙඩියක් පමණ ඇතිව අනුක්‍රමයෙන් ගඟා
වතීහිවූ සමුද්‍රාදියෙහි පර්වතකූට පමණත් මහත්වේද එපරිද්
දෙන් රූපසකන්ධයද පළමුවෙන් මාතෘකුක්ෂියෙහි හිමාලයෙහි
හුණපුපුළු නම් ප්‍රාණියක්හුගේ උදරරෝමයක් ප්‍රසනාග් තල
තෙල ගලා සත්විටක් ගැසූකල සත්වෙනි වාරයෙහි රෝමාග්‍ර
යෙහි සිටි තෙල් බින්දු පමණවූ කලල රූපයක් ඇතිවේ.
ඒ කලල රූපයෙහි ප්‍රතිසන්ධිචිත්තයත් අටගනී මෙසේ හටගත්
ඒ ප්‍රතිසන්ධිචිත්තයට අනතුරුව භවාඟසිත් තුදුසෙක් පහළවේ.
ඒට අනතුරුව මනොවාරාවර්ජනය පහළවේ ඒට අනතුරුව
ජන්මයෙහි සන්තොෂ උපදවමින් ආත්මග්‍රහණය කරවමින්
ලොභසම්ප්‍රයුක්ත සිත්පහළවේ මෙසේ ඇතිවූ පහන් තලතෙලි
තතක් වැනිවූ ඒ පූර්වෝක්තවූ කලලරූපය ක්‍රමයෙන් වැඩී සති
යක් ගිය කල්හි මස්දෙවිදියතතක් වැනිවූ අර්බුදාවස්ථාවට පැමි
ණේ. දෙසතියක් ගියකල්හි මේඅර්බුදාවස්ථාවෙන්පෙරළී බොල්
කොට පසු ලතුදියතතක් වැනිපෙශී අවස්ථාවට පැමිණේ තුන්
සතියක් ගියකල්හි මේ පෙශී අවස්ථාවෙන් පෙරළී මූරුතමල්
කැකුලක්වැනි ඝන අවස්ථාවට පැමිණේ, සිව්සතියක් ගියකල්හි
සේදූමස්කැටියෙක නැඟී පස්පොළක් මෙන් දෙඅත දෙපය ඉස
තේරී ප්‍රශාඛාවස්ථාවට පැමිණේ ඉක්බිති පස්වෙනි සතියෙහි
පටන් එකොළොස්වන සතියදක්වා මෙදෑතුරෙහි අතුල් පතුල්
ඇඟිලි ඇස් මූඛ කන් නාසා කිසමග වසමග ආදියද ඉතා සූක්ෂම
වූ ඇටද ඉසකෙස්ද වෙරලොම්ද හටගෙණ ක්‍රමයෙන් වැඩී සම්පූ
ර්ණව බඹයක් පමණවේ ගවමහිස හස්ත්‍යස්වාදීන්ගේ ශරීර වශ
යෙන් පර්වතකූටප්‍රමාණවේ මහමූහුදුමස් කැස්බන්ගේ වශයෙන්
නොයෙක් සියගණන් යොදුන් පමණවේ. තවද යම්සේ පෙණ
පිඩ හටගත් කෙණෙහිත් නැසෙන්නේද මදක්තැන් ගොසිනුත්
නැසෙන්නේද මුහුදට ගියකල ඒකාන්තයෙන්ම නැසෙන්නේද
එමෙන් රූපසකන්ධයද කලලාවස්ථාවෙහිත් නැසෙන්නේය. අර්
බුදාවස්ථාවෙහිත් නැසෙන්නේය. පෙශිඅවස්ථාවෙහිත්නැසෙන්
නේය ඝන අවස්ථාවෙහිත් නැසෙන්නේය ප්‍රශාඛාදි අවස්ථාවෙ
හිත් නැසෙන්නේය. මවුකුසින් බිහිවූකල්හිත් නැසෙන්නේය.
මන්දදසකයෙහිත් නැසෙන්නේය ක්‍රීඩාදසකයෙහිත් නැසෙන්
නේය වර්ණදසකයෙහිත් නැසෙන්නේය බලදශකයෙහිත්

නැසෙන්නේය ප්‍රඥාදසකයෙහිත් නැසෙන්නේය ඝාණදශකයෙ
හිත් නැසෙන්නේය ප්‍රාග්භාරදසකයෙහිත් නැසෙන්නේය ප්‍රවං
කදසකයෙහිත් නැසෙන්නේය මොඹුහදසකයෙහිත් නැසෙන්
නේය සයන දසකයෙහිත් නැසෙන්නේය මේ අතර නොනැසී
සිටියේවී නමුත් සතායුෂ්කයන්ගේ රූපය අවුරුදු සියයක් පිරු
ණුකල ඒකාන්තයෙන් බිඳේ මරුමුඛයට පැමිණ සුණුවිසුණුවේ.
එහෙයින් බුදුහු රූපස්කන්ධය පෙණපිඬකට බඳුවූ උපමා ඇත්
තේයයි වදාළසේකි. වෙදනාස්කන්ධය දියබුබුලක් බඳුවූයේ කො
සේද? යම්සේ දියබුබුල කිසි සාරත්වයක් නැත්තේ දුර්වලද ඇර
ගත නොහැක්කේද එයින් ඵලකයක් හෝ ආසනයක් හෝ අඟු
ලිමුද්‍රිකාවක්හෝ කර්ණභූෂණයක් හෝ කොටගත නොහැක්කේ
වේද එමෙන් වේදනාවද අසාරය දුර්වලය නිත්‍යය ධ්‍රැවයයි සිතා
ගත නොහැක්කේවේ ගතත් එලෙස ස්ථිරව නොසිටී, තවද යම්
සේ ඒ දියබින්දුවෙන් නැංගාවූ බුබුල එතන එතනම නැසෙන්
නේද බොහෝකලක් සිටින්නේ නොවෙයි එපරිද්දෙන් එක
අසුරුසනක් පමණ කල්හි නොයෙක් කෙළලක්‍ෂගණන් සුඛ
දුඃඛොපෙක්‍ෂා වේදනා පහළව නැසෙන්නේවේ, තවද යම්සේ
දියබුබුල දියපිටනැඟී ධූලිමල දියබිඳු දියරොම්එකතැන්කොට
දවානකරඹු පියනක්මෙන් වටකොට ගන්නා වායුවයයි යනකා
රණා සතරකින් ඇතිවේද එපරිද්දෙන්ම වේදනාවද චක්‍ෂුඃප්‍රසා
දදී වස්තුවය රූපාදී ආලම්බනය ලොභාදීකෙලශමලය චක්‍ෂුස්ප
ර්ශාදී ස්පර්ශ සට්ටනය යන සතරකාරණයන් නිසා පහළවේ එහෙ
යින් බුදුහු වේදනාස්කන්ධය දියබුබුලක් හා සදෘශයයි වදාළසේකි
සංඥාස්කන්ධය මිරිඟුදිය හා සදෘශවූයේ කෙසේද? යම්සේ ග්‍රීෂ්ම
කාලයෙහි මහ අවුවෙහි පෙණෙන මිරිඟුදිය චචලව මහවතුරක
රළ ගසන්නාසේ පෙණේද එමෙන් නිල්පැහැය රත්පැහැයයනා
දීන් සලකුණු ගන්නා සංඥාවද අනුභවපිණිස පොපිගනී තවද
යම්සේ මිරිඟුදියපිරුණු පොකුණක්මෙන් පෙණී පිපාසාවෙන්
පීඩිතවූ මෘගයන් වංචාකෙරේද එමෙන් මේ නිල්වන් රූපය මේ
රන්වන් රූපය මේ සමවන් රූපය සුභය මනාපය සැපය නිත්‍ය
යයි ප්‍රශංසා කරවා සත්වයන් වංචාකෙරෙයි එහෙයින් බුදුහු සංඥා
ස්කන්ධය මිරිඟුදිය හා සමානයයි වදාළසේකි. සංස්කාරස්කන්ධයද
අසාරනිස්සාරාර්ථයෙන් කදලිස්කන්ධයක් හා සදෘශවේ යම්සෙ
කෙසෙල්කඳින් කිසිවක්ගෙණ ගොනැස් පලහන් පට්ටිකාදීවූ
කිසිගෘහකර්මාන්තාදියක් කොටගත නොහැකිවෙද ගතහොත් ස්ථිරව
නොසිටීද එපරිද්දෙන් සංස්කාරයෝද නිත්‍යය ධ්‍රැවය මමය මා
ගේයයි ග්‍රහණය කටයුත්තාහු නොවෙත්, තවද යම්සේ කදලිස්ක

න්ධය බොහෝ පතුරුවැඩි සමූහවේද එපරිද්දෙන් සංස්කාරස්ක
න්ධය බොහෝ ධර්මරාශියෙක්වේ, තවද යම්සේ කදලිස්කන්ධයෙහි
පිටපතුරු වෙන පැහැයෙක්වේද ඇතුළු පතුරුත් ක්‍රමයෙන්
වෙන වෙන ආකාර ඇතිවේද,එපරිද්දෙන් වෙදනාස්පර්ශාදිනානා
ස්වභාව ඇති සමපණස් ධර්මයෝ එක්ව සංස්කාරස්කන්ධ නම්වේ
එහෙයින් බුදුහු සංස්කාරස්කන්ධය කදලිස්කන්ධයක් හා සදෘශයයි
වදාළසේක. විඥානස්කන්ධයද අසාරාර්ථයෙන් ඉන්ද්‍රජාලයක් වැනි
වේ, හේ කෙසේද යම්සේ ඉන්ද්‍රජාලය මදකල් පැවත ඉතාශීඝ්‍රව
නැතිවේද ඊටවඩා සතසහස්‍රගුණයෙන් චිත්තයම ස්වල්පකාලයක්
පැවත නැසෙන්නේවේද එකම චිත්තයෙන් පුරුෂයා ආයේය
ගියේය සිටියේය උන්නේයයි වැටකෙන්නේය එනකල්හි වෙන
සිතෙක්වේ යන කල්හි වෙන සිතෙක්වේ, සිටින කල්හි වෙන
සිතෙක්වේ හිඳිනාකාලාදියෙහිද වෙන වෙන සිත්වෙත්, තවද
යම්සේ ඉන්ද්‍රජාලය මහජනයා වචිතකොට කැටකැබිලිති ආදී
කිසිවක් රන් රිදී මිණිමුතුයයි ග්‍රහණයකරවාද එපරිද්දෙන් මේ
විඥානස්කන්ධය නම්වූ චිත්තයත් එකම චිත්තයෙන් ආවාක්මෙන්
ගියාක්මෙන් සිටියාක්මෙන් උන්නාක්මෙන් සත්වයන් වචාකො
රේ, එහෙයින් බුදුහු මේ විඥානස්කන්ධය ඉන්ද්‍රජාලයකට බඳු
උපමා ඇත්තේයයි වදාළසේක.

තවද—රාශිවත් සාර්ථවචෙව චක්‍රවත් මුෂ්ටි වත්තථා
ස්කන්ධෙෂු පඤ්චසු ප්‍රාඥෛ රාත්ම ශබ්දඃ ප්‍රගීයතෙ.

කියා ෂට්දර්ශනසංග්‍රහ නම්වූ බෞද්ධතර්කයෙහි කී බැවින්රාශි
වත්, ධාන්‍යරාශිය යවරාශිය මුද්ගරාශියයි කීකල ධාන්‍ය යව මුද්
ගයන් හැර අන් රාශියක් නැත්තාක් මෙන්ද සාර්ථවත් ජංඝ
සාර්ථය සකටසාර්ථයයි කීකල ගැල් ගොන් බඩු පොදි වණික්
ජනයා හැර අනික් සාර්ථයයි යනදෙයක් නැත්තාක්මෙන්ද චක්‍ර
වත් අලාතචක්‍රය රථචක්‍රය කුලාලචක්‍රයයි කීකල මණ්ඩලාකාර
යෙන් වලල්ලක්මෙන් වටගිය ගිනිපෙනෙල්ල පෝරුකඩ විනා
අන්චක්‍රයයි යන දෙයක් නැත්තාක් මෙන්ද මුෂ්ටිවත් මිටයයිකී
කල අකුලුවාගත්කල ඇඟිලිපසට මිටයයි යන ව්‍යහාරමුත් ඇඟි
ලිහැර මිටයයි යන අන්වස්තුවක් නැත්තාක්මෙන්ද ස්කන්ධෙෂු
පඤ්චසු රූපවේදනා සංඥාසංස්කාර විඥානය යන පඤ්චස්කන්ධ
යෙහි ආත්මශබ්දඃ ආත්මශබ්දය යන ව්‍යවහාර ශබ්ද මාත්‍රයෙක්
ප්‍රාඥෛඃ නුවණැත්තන් විසින් ප්‍රගීයතෙ, කියනුලැබේ හෙවත්
ව්‍යවහාර කරණුලැබේ, එහෙයින් මෙසේ ස්වභාව ධර්මරාශි මාත්‍ර
වූ ආත්ම ආත්මීය ශූන්‍යවූ ස්කන්ධපඤ්චකයෙහි මමයමාගේයයන
විපරීත ග්‍රහණය නොකටයුත්තේයයි සම්මෝහවිනොදනී විභ
ඞ්ගාර්ථකථා නම්වූ අටුවාසෙහි කියනලදමැයි.

## විශේෂයක්

තත්‍ථ රූපාදීනං ඵෙණපිණ්ඩාදීහි එවං සදිසතා වෙදිතබ්බා
යථාහි ඵෙණපිණ්ඩො නිස්සාරොව එවං රූපම්පි නිච්චසාර ධුවසාර
අත්තසාර විරහෙන නිස්සාර මෙව, යථා ච සො ඉමිනා පත්තං වා
ථාලකං වා කරිස්සාමීති ගහෙතුං න සක්කා ගහිතොපි තමත්ථං
න සාධෙති භිජ්ජතෙව එවං රූපම්පි නිච්චන්ති වා ධුවන්ති වා මම
න්ති වා ගහෙතුං න සක්කා ගහිතම්පි න තථා තිට්ඨති අනිච්චං
දුක්ඛං අනත්තා අසුභඤ්ඤෙවහොතී,ති එවං ඵෙණපිණ්ඩසදිසමෙව
හොති යථා වා පන ඵෙණපිණ්ඩො ඡිද්දාවඡිද්දො අනෙකසන්ධි ඝටි
තො බහුන්නං උදකසප්පාදීනං පාණානං ආවාසො එවංරූපම්පි
ඡිද්දාවඡිද්දං අනෙකසන්ධිඝටිතං කුලවසෙන චෙත්ථ අසීති කිමි
කුලානි වසන්ති තදෙව තෙසං සූතිඝරම්පි වච්චකුටිපි ගිලානසාලාපි
සුසානම්පි න තෙ අඤ්ඤත්‍ථ ගන්ත්වා ගබ්භවුට්ඨානාදීනි කරොන්ති
එවම්පි ඵෙණපිණ්ඩ සදිසං යථාච ඵෙණපිණ්ඩො ආදිතොව බදරපක්ක
මත්තො හුත්වා පුන අනුපුබ්බෙන පබ්බත කූටමත්තොපි හොති
එවං රූපම්පි ආදිතො කලලමත්තං හුත්වා අනුපුබ්බෙන ව්‍යාම
මත්තම්පි ගොමහිස හත්ථි ආදීනං වසෙන පබ්බතකූටමත්තම්පි
හොති මච්ඡකච්ඡපාදීනං වසෙන අනෙකයොජනසතප්පමාණම්පි
එවම්පි ඵෙණපිණ්ඩසදිසං,යථාච ඵෙණපිණ්ඩො උට්ඨිතමත්තො භිජ්ජති
ථොකං ගන්ත්වාපි සමුද්දං පත්වා පන අවස්සමෙව භිජ්ජති එව
මෙව රූපම්පි කලලභාවෙ භිජ්ජති අබ්බුදාදිභාවෙපි අන්තරා පන
අභිජ්ජමානම්පි වස්සසතායුකානං වස්සසතං පත්වා අවස්සමෙව
භිජ්ජති මරණමුඛෙ චුණ්ණවිචුණ්ණං හොති එවම්පි ඵෙණපිණ්ඩ
සදිසං යථාපන බුබ්බුලො අසාරො එවං වෙදනාපි යථාවසො අබ
ලො අගය්හුපගො න සක්කා තං ගහෙත්වා ඵලකංවා ආසනං වා
කාතුං ගහිතගහිතොපි භිජ්ජතෙව එවං වෙදනාපි අබලාඅගය්හු
පගා න සක්කා නිච්චා'ති වා ධුවා'ති වා ගහෙතුං ගහිතාපි න තථා
තිට්ඨති එවං අගය්හුපගතායපි වෙදනා බුබ්බුලසදිසාය යථා පන
තස්මිං තස්මිං උදකබින්දුම්හි බුබ්බුලො උප්පජ්ජති චෙව නිරුජ්ඣති ච
න චිරට්ඨිතිකො හොති එවං වෙදනාපි උප්පජ්ජති චෙව නිරුජ්ඣ
ති ච න චිරට්ඨිතිකා හොති එකච්ඡරාක්ඛණෙ කොටිසතසහස්ස
සංඛා උප්පජ්ජිත්වා නිරුජ්ඣති, යථාච බුබ්බුලො උදකබින්දුං උදක
ජල්ලකං සංකඩ්ඪිත්වා පුටංකත්වා ගහණවාතඤ්චා'ති චත්තාරිකාරණා
නි පටිච්ච උප්පජ්ජති, එවංවෙදනාපි වත්ථුං ආරම්මණං කිලෙස
ජාලං ඵස්ස සංඝට්ටනංචා'ති චත්තාරි කාරණානි පටිච්ච උප්පජ්ජති
එවම්පිවෙදනා බුබ්බුලසදිසා සඤ්ඤාපිඅසාරකට්ඨෙන මරීචිකාසදිසා
නහි සක්කා තං ගහෙත්වා පිවිතුං වා භාජනං වා පූරෙතුං තථා

අගය්හුපගමනෙන තබ්භාවම්පි වෙදනා සදිසමෙව අපිච යථා මරීචි විප්ඵන්දති සඤ්ජාතූමිවෙගො විය ඛායති එවං නීලසඤ්ඤාදිභෙද සඤ්ඤාපි නීලාදි අනුභවනත්ථාය ඵන්දති විප්ඵන්දති යථා ච මරීචි මහාජනං විප්පලම්භෙති පරිපුණ්ණවාපි විය පරිපුණ්ණනදී විය දිස්සතීති වදාපෙති එවං සඤ්ඤාපි විප්පලම්භෙති ඉදං නීලකං සුභං සුඛං නිච්චන්ති වදාපෙති පීතකාදීසුපි එසෙව නයො එවං විප්පලම්භනෙනාපි මරීචිසදිසා සඞ්ඛාරාපි අසාරකට්ඨෙන කදලික්ඛන්ධසදිසා තථා අගය්හුපගමනෙන යථෙව හි කදලික්ඛන්ධතො කිඤ්චි ගහෙත්වා න සක්කා ගොපානසීආදීනං අත්ථාය උපනෙතුං උපනීතම්පි න තථා හොති එවං සඞ්ඛාරාපි න සක්කා නිච්චාදිවසෙන ගහෙතුං ගහිතාපි න තථා හොන්ති යථා ච කදලික්ඛන්ධො බහුවට්ටිසමොධානො හොති එවං සඞ්ඛාරක්ඛන්ධොපි බහුධම්මසමොධානො යථා ච කදලික්ඛන්ධො නානාලක්ඛණො අඤ්ඤොයෙව හි බාහිරාය පත්තවට්ටියා වණ්ණො අඤ්ඤො තතො අබ්භන්තරබ්භන්තරානං එවමෙව සඞ්ඛාරක්ඛන්ධෙපි අඤ්ඤදෙව ඵස්සස්ස ලක්ඛණං අඤ්ඤං චෙතනාදීනං සමොධානෙත්වා පන සඞ්ඛාරක්ඛන්ධො ත්වෙව වුච්චතී'ති එවම්පි සඞ්ඛාරක්ඛන්ධො කදලික්ඛන්ධ සදිසො විඤ්ඤාණම්පි අසාරකට්ඨෙන මායාසදිසං තථා අගය්හුපගමනෙන යථා ච මායා ඉත්තරා ලහුපච්චුපට්ඨානා එවං විඤ්ඤාණං තං හි තතො පි ඉත්තරතරං චෙව ලහුපච්චුපට්ඨානතරං ච තෙනෙව හි චිත්තෙන පුරිසො ආගතො විය ඨිතො විය නිසින්නො විය හොති අඤ්ඤදෙවචා ගමනකාලෙ චිත්තං අඤ්ඤං ගමනකාලාදීසු එවම්පි විඤ්ඤාණමායාසදිසං මායාච මහාජනං වඤ්චෙති යං කිඤ්චි වදෙව ඉදං සුවණ්ණං රජතං මුත්තන්තිපි ගාහාපෙති විඤ්ඤාණම්පි මහාජනං වඤ්චෙති තෙනෙව චිත්තෙන ආගච්ඡන්තං විය ගච්ඡන්තං විය ඨිතං විය නිසින්නං විය කත්වා ගාහාපෙති අඤ්ඤදෙව ආගමනෙ චිත්තං අඤ්ඤං ගමනාදීසු එවම්පි විඤ්ඤාණං මායා සදිසං.

තවද මේ පඤ්චස්කන්ධයෝම සියලු සංසාර දුක්ඛයට පිහිටව සිටිත්, ඒ එසේමය දුවීමෙන් දරට ගහම කරණ ගින්නක්මෙන් අංකුශ ප්‍රහාරයට ලකසෙයින් දංසමකසාදී පීඩාවට පිහිටවූ ගෙරූපසෙයින් නිෂ්පන්න සස්‍යලාභයන්ට ක්ෂෙත්‍රයසෙයින් ග්‍රාමඝාතකයන්ට ග්‍රාමයසෙයින් පඤ්චුපාදානස්කන්ධයෝම දුක්ඛයට පිහිට වෙත් ජාත්‍යාදීහු නානාප්‍රකාරයෙන් විබාධනය කරන්නාහු භූමියෙහි තෘණලතාදීන් සෙයින් වෘක්ෂයන්කෙරෙහි පුෂ්පඵල පල්ලව සෙයින් උපාදානස්කන්ධයන්ටද ජාතිය ආදී දුක්ඛය වේ ජරාව මධ්‍යදුක්ඛ වෙයි මරණ පරියොසානදුක්ඛ වෙයි මරණා

සන්තානයෙහිවූ දුක්පහරින් පරිදහන වසයෙන් ශොකදුක්ඛ වෙයි. ඒ අසහනවසයෙන් අතිසයින් විප්‍රලාපවසයෙන් පරිදෙවදුක්ඛ වෙයි. ඉක්බිත්තෙන් විනාශවන්වූ ශරීරදහය ශොසය රූජාය යන මොවුන් කරණ ධාතුසංක්ෂොභය සංස්කාරය අනිෂ්ට ප්‍රෂ්ටව්‍ය සමායොගයෙන් කයට ආබාධනදුක්ඛය වන්නේය. ඒ දුක්ඛයෙන් බාධියමානවූ පෘථක්ජනයන්ට ඒ ප්‍රත්‍යයෙන් ප්‍රතිඝවශයෙන් බාධනකවූ දුක්ඛය දෞර්මනස්‍යය නම්වේ; ශො කාභිවෘද්ධියෙන් ජනිතවූ විෂාදනසංඛ්‍යාත බැගෑබව ඇත්තවුන් ගේ අනුත්තාතිජල්පායන දුක්ඛය උපායාසනම්වෙයි; මනොරථ විඝාතප්‍රාප්තයන්ට උපදනා ඉච්ඡාවිඝාත දුක්ඛය ඉච්ඡිතාලාභ දුක්ඛනම් වෙයි, මෙසේ නානාප්‍රකාරයෙන් උපපරීක්ෂ්‍ය මානවූ උපාදානස්කන්ධයෝම දුක්ඛයයි නොයෙක් අක්ෂිරොග කර්ණරෙ ගාදී වශයෙන් එකක් එකක් වර්ණනා කරනහොත් නිරවශෙෂ යෙන් වර්ණනාකිරීමට නොයෙක් කල්පකොටි ශතසහස්‍රයෙ හිදු උස්සාහ කළත් නොපිළිවන ඒ කාරණයෙන් සියලුම දුක්ඛය එක ජලබින්දුවක රස දැක්වූකල්හි සියලු සමුද්‍රජලය රසාත් මෙබඳුයයි හැඟෙනනාසේ යම්කිසි පඤ්චස්කන්ධකෙණෙක් ඇද්ද ඒ සියල්ලෙහිම පැවති දුක්ඛයන් සාමාන්‍ය නිර්දෙසයෙන් සංක්ෂෙ පනයකොට දක්වන්නට සංක්ෂෙපයෙන් පඤ්චපාදානස්කන්ධයෝ දුක්වන්නාහුයයි භාග්‍යවත්වූ සර්වඥ රාජොත්තමයානන් වහන් සේ විසින් වදාරණලද්දේයයි යනුද දක්වන්නට වදාළහ,

### බුද්ධඝොෂ මහතෙරුන් විශුද්ධිමාර්ගයෙහි

තථාහි ඉද්ධනමිව පාවකො ලක්ඛමිව පහරණානි ගොරූප මිවඩංසමකසාදයො ඛෙත්තමිව ලායකා ගාමං විය ගාමඝාතකා උපාදානක්ඛන්ධපඤ්චකමෙව ජාති ආදයො නානප්පකාරෙ බාධාම යතා තිණලතාදීනි විය භූමියං පුප්ඵඵල පල්ලවාදීනි විය රුක්ඛෙසු උපාදානක්ඛන්ධෙසු යෙව නිබ්බත්තනාති උපාදානක්ඛන්ධා නච ආදි දුක්ඛං ජාතිමජ්ඣෙදුක්ඛං ජරා; පරියොසානදුක්ඛං මරණං, මාරණන්තිකදුක්ඛාභිඝාතෙන පරිඩය්හමානදුක්ඛං සො කො; තදසහනතො ලාලප්පනදුක්ඛං පරිදෙවො. තතො ධාතු ක්ඛොභ සංඛාත අනිට්ඨපොට්ඨබ්බ සමායොගතො වෙතො කායස්ස ආබාධනදුක්ඛංදුක්ඛං තෙන බාධියමානානං පුථුජ්ජ නානං තත්‍ර පටිඝුප්පත්තිතො බාධනදුක්ඛං දොමනස්සං; සොකා භිවුඩ්ඪියා ජනිත විසාදානං අනුත්ථුනන දුක්ඛං උපායාසො; මනො රථ විඝාතප්පත්තානං ඉච්ඡාවිඝාතදුක්ඛං ඉච්ඡිතා ලාභොති එවං නානප්පකාරතො උපපරික්ඛියමානා උපාදානක්ඛන්ධාව

දුක්ඛාති යදෙතං එකමෙකං දසෙසත්වා වුච්චමානං අනෙකෙහිපි කප්පෙහි නසක්කා අනවසෙසතො වත්තුං; තං සබ්බම්පි දුක්ඛං එකජලබින්දු මහිසකල සමුද්දජලරසං විය යෙසුකෙසුචි පචසුඋ පාදානක්ඛන්ධෙසු සංඛිපිත්වා දසෙසතුං සංඛිපෙනන පචුපාදාන ක්ඛන්ධා දුක්ඛාති භගවා අවොචයි.

මේ පචසක්ඛන්ධයෙහි විනිශ්චයයයි දුඃඛසත්‍ය විනිශ්චය මෙතෙකින් දතයුතු. සමුදයනිර්දේශයෙහි වනාහී යම් මේ තෘෂ්ණාවක් තොමෝ පුනර්භවය කරන්නීද රූපශබ්ද ගන්ධරසාදී ඒ ඒ අරමුණෙහි ලග්නවන්නාවූ නන්දිරාගයෙන් යුක්තවන්නීද නන්දිරාගය හා සමග පවත්නීද ඒ ඒ භවයෙහි ඇල්ම පිපාසාවසයෙන් තොසය කරන්නීද ඒ තෘෂ්ණාතොමෝ කවරක්වන්නීද කාමාස්වාද වශයෙන් පැවති කාමතෘෂ්ණාවය අටළොස් ප්‍රභෙදයක් ඇති ශාස්වතදෘෂ්ටිය හා එක්වපැවති භවතෘෂ්ණාවය සුසාළිස් ප්‍රභෙදයක් ඇති උච්ඡෙද දෘෂ්ටිය හා එක්ව පැවති විභවතෘෂ්ණාවය යන මේ ත්‍රිවිධ තෘෂ්ණාව සමුදයසත්‍යනම් වන්නේය මේ සමුදය සත්‍යයෙහි නන්දිරාගය මස් වැදූල්ලක්කොට කියන්ට කාරණා ඇත්තේය. ඒ කවර අර්ථයකින්දයත්? මස්වැදූල්ල රජ බමුණු වෙළඳ ගොවි ආදීවූ බොහෝ සත්වයන් විසින්ද කාක සොණ සිගාලාදී තිරශ්චීනය යන බොහෝ සත්වයන් විසින් ප්‍රාර්ථනා කරණ ලද්දීය. අවිද්‍යාමදයෙන් මත්වූ එසේම සත්වයෝ රූපශබ්දාදීවූ ඒ ඒ අරමුණෙහි ඇලෙන්නාවූ නන්දිරාගයට පැමිණ භව ප්‍රාර්ථනාකරන්නාවූ යම්සේ මස්වැදූල්ල ත්බුතිබුතැන ඇලේද එපරිද්දෙන් නන්දිරාගයෙන් සත්වයන් භවයෙහි ලග්න වන්නාහ. දුකටපැමිණද උකටලී නොවන්නාහ. එහෙයින් නන්දිරාගයට මස්වැදූල්ලයයි කියනු ලැබෙයි. එයින් වදාළහ, කුමාරකාශ්‍යප ස්ථවිරයන් වහන්සේට.

### වම්මිකසූත්‍රයෙහි.

මංසපෙසීතිඛො භික්ඛු නන්දිරාගස්සෙතං අධිවචනංති. මෙසින් විනිශ්චය කරණ ලද්දේ සමුදය සත්‍යයයි දතයුතුයි. දුක්ඛනිරොධ සත්‍යයට යො තස්සායෙව තණ්හාය අසෙසවිරාග නිරොධො යනාදීන් සමුදයනිරොධයම කියනලද්දේය. කුමක් හෙයින් දයත්? සමුදය නිරොධවූ කල්හි දුක්ඛනිරොධයවෙයි අන් පරිද්දෙකින් නොවන්නේය.

යථාපි මූලෙ අනුපද්දවෙ දළ්හෙ  
ඡින්නොපි රුක්ඛො පුනරෙවරූහති  
එවම්පි තණ්හානුසයෙ අනූහතෙ  
නිබ්බත්තති දුක්ඛමිදං පුනප්පුනංති.

යතුහෙයින් යම්සේ පණුමන් විදීම් සැත්පැහැරීම් ආදීවූ උපද්‍රව රහිත කල්හි එහෙයින්ම ස්ථිරකල්හි ශාඛාදි ඡේදනයෙන් ඡින්නවූ වෘක්ෂය නොනැසුනු සෙයින් නැවතත් උපදීද එහෙයින්ම කාමරාගානුසය භවරාගානුසය සඞ්ඛ්‍යාතවූ තෘෂ්ණානුසය නොනා කල්හි මේ දුක්ඛයද නැවත නැවත උපදනේය. මෙසේ මෙහෙයකින් සමුදය නිරොධයෙන්ම දුක්ඛනිරොධය වේද ඒ කාරණයෙන් දුක්ඛනිරොධය දෙශනා කරන්නාවූ සර්වඥයන් වහන්සේ සමුදයනිරොධයෙන් දෙශනාකොට වදාළසේක.

### එයින් කීහ.

ඉති යස්මා සමුදය නිරොධෙනෙව දුක්ඛං නිරුජ්ඣති තස්මා භගවා දුක්ඛනිරොධං දෙසෙන්තො සමුදයනිරොධෙන දෙසෙසි.

ඒ එසේමය සිංහතෙමේ යමක්හු විසින් ශරය නම්‍ා කොරෙහි විදුනාලද්ද ඔහුකොරෙහිම තමාගේ බල දක්වයි, ශරයෙහි නොදක්වයි එසේම බුදුහු කාරණයෙහිම පිළිපදිති, ඵලයෙහි පිළිනොපදිති යනමේ අර්ථය දක්වනපිණිස 'සීහසමාන වුත්තයි නොහි තථාගතා තෙ දුක්ඛං නිරොධෙන්තා දුක්ඛනිරොධච දෙසෙන්තා හෙතුම්හි පටිපජ්ජන්ති න ඵලෙ, යනු දක්වනලදී. යම් සේ සුනඛ තෙමේ කිසිවක්හු විසින් කැටින් පහර දුන් කල්හි බුරමින් කැටමැඩහෙයි ප්‍රහාරදායකයා කරා නොදිවේ එසේම අන්‍ය තීර්ථකයෝ දුක්ඛය නිරුද්ධකරණු කැමැත්තාහු කායකල මථයෙහිම යෙදෙති, කෙලශ නිරොධයෙහි නොයෙදෙති යන මේ අර්ථය දක්වන පිණිස ' සුවානවුත්තිනො පන අඤ්ඤතිත්ථියා'' තෙ දුක්ඛං නිරොධෙන්තා දුක්ඛ නිරොධච දෙසෙන්තා අත්ත කිලමථානුයොග දෙසනාදීහි ඵලෙපටිපජ්ජන්ති නහෙතුම්හි යනු දක්වනලදී. මෙසේ දුක්ඛනිරොධයට සමුදයනිරොධවශයෙන් දෙශනාකිරීමෙහි සප්‍රයොජනය වෙදිතව්‍යයි මේ වනාහී අර්ථයි. යො තස්සායෙව තණ්හාය යමනාන හි තෘෂ්ණාවනම් පොනොභවිකායයි කියා කාමතෘෂ්ණාදීවශයෙන් විභාගකළ තෘෂ්ණාවගේ විරාගයයි කියනු ලැබෙයි.

තස්සායෙව තණ්හායා'ති තස්සපොනොභවිකාති වත්වා කාම තණ්හාදි වසෙන විභත්තතණ්හාය විරාගො වුච්චති මග්ගො විරාගා විමුච්චතීතිහි වුත්තං විරාගෙන නිරොධො විරාග නිරොධො අනුසයසමුග්ඝා තතො අසෙසවිරාගෙන නිරොධො අසෙස විරාග නිරොධො අථවා විරාගොති පහානං වුච්චති තස්මා අසෙසො නිරොධොති එවමෙපත්ථ යොජනා දට්ඨබ්බා අත්ථතො පන

සඞ්ඛාතෙව එතානි නිබ්බානස්ස වේවචනානි පරමත්ථතො හි දුක්ඛනිරොධං අරියසච්චන්ති නිබ්බානං වුච්චති යස්මා පන තං ආගම්ම තණ්හා විරජ්ජති චෙව නිරුජ්ඣති ච තස්මා විරාගොති ච නිරොධොතිච වුච්චති යස්මා ච තදෙව තස්ස චාගාදයො හොන්ති කාමගුණාලයෙසු චෙත්ථ එකොපි ආලයො නත්ථි තස්මා චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො වුච්චතියි.

යනුවෙන්කළ විනිශ්චයද දතයුතුයි. ඒ මෙනිර්වාණය සර්වදුඃඛ ශාන්තියට ප්‍රත්‍යය වන බැවිනුදු සියලු ක්ලේශ සන්තාප නැති බැවිනිදු ශාන්තලක්ෂණ ඇත්තේය භඟනැතිබැවින් නොගිලි යෙන රස ඇත්තේය. හෙවත් අච්චුති බව කෘත්‍යයකොට ඇත් තේය. රසය කෘත්‍යය යනු එකාර්ථයි. හෙද නොගිලිහෙන සම්පත් ඇත්තේය යන අර්ථයි අනාදිමත් සසර සිහිනෙනුදු නොදක්නාලද විරූප බැවිනුදු දුටුකෙණෙහිම භය නොකරයි, කියන බඳුව අස්වස් කෙරෙයි, කෘත්‍යාර්ථයෙන් අස්වස්කරණ කෘත්‍යයඇත්තේය සඞ්ඛතනිමිත්ත නැතිබැවිනුදු රාගාදි නිමිත්ත නැතිබැවිනුදු අනිමිත්තව වැටහෙන්නේයි. රාගාදි සර්වප්‍රපඤ්ච ව්‍යප ශමනයට නිමිත්ත බැවින් නිස්ප්‍රපඤ්ච බව එළවන්නේය,

එයින් කීහ.

තයිදං සන්තිලක්ඛණං අච්චුතිරසං අස්සාසකරණරසං වා අනිමිත්තපච්චුපට්ඨානං නිප්පපඤ්චපච්චුපට්ඨානංවා-යි.

මේ මෙහි සංක්ෂෙපය විස්තරය වනාහි විශුද්ධිමාර්ගයෙහි නිරොධසත්‍ය නිර්දෙශ කථාවෙන් බලා දතයුතුයි. දුක්ඛනිරොධ ගාමිනී ප්‍රතිපදාර්‍ය සත්‍යයෙහි චතුස්සත්‍යය ප්‍රතිවෙධය පිණිස ප්‍රතිපන්නයෝගීහුගේ නිවන් අරමුණුකොට ඇති අවිද්‍යානුසය සමුච්ඡෙද කරණුවූ ප්‍රඥාචක්ෂුස සම්‍යක්දෘෂ්ටිය නම්වේ, ඒ සම්‍යක් දෘෂ්ටිතොමෝ අවිපරීත වශයෙන් මනාකොට දැක්ම ලක්ෂණ කොට ඇත්තීය තත්වාර්ථයන් ප්‍රකාශකරණ බව කෘත්‍යයකොට ඇත්තීය අවිද්‍යානැමැති අන්ධකාරය විධ්වංශනය කිරීම ප්‍රත්‍යුප ස්ථාන සංඛ්‍යාත වැටහීම්කොට ඇත්තීය, එයින් කීහ.

චතුසච්චපටිවෙධාය පටිපන්නස්සයොගිනො නිබ්බාණාරම්ම ණං අවිජ්ජානුසය සමුග්ඝාතකං පඤ්ඤාචක්ඛු සම්මාදිට්ඨි සා සම්මා දස්සන ලක්ඛණා තත්තපකාසනරසා අවිජ්ජන්ධකාරවිද්ධංසන පච්චු පට්ඨානා-යි.

එසේම සම්‍යක් දෘෂ්ටීන් සම්පූර්ණවූ දෘෂ්ටි ඇතියහුගේ ඒ සම්‍යක් දෘෂ්ටිය හා සම්ප්‍රයුක්තවූ කාමසංකල්පාදී මිථ්‍යාසංකල්පයන් සමුඝාතය කරණ සිත්හු නිවන්කොටස්හි ආරෝපනය සම්‍යක්කල්පනා නම්වෙයි, ඒ සම්‍යක් කල්පනාතෙමේ සිත්හු නිවන් අරමුණෙහි නැගීම ලක්‍ෂණකොට ඇත්තේය අපිණයයි කියනලද නිවන් අරමුණෙහි මාර්ගසිත්හු අලවන කෘත්‍යය ඇත්තේය. මිථ්‍යාසංකල්පනාවගේ ප්‍රහාණකිරිම වැටහිම්කොට ඇත්තේය, එසින් කිහ.

තථා සම්පන්නදිට්ඨිනො තං සම්පයුත්තං මිච්ඡාසංකප්පසමුඝාත චෙතසො නිබ්බාණං පටිපදාභිනිරොපනං සම්මාසංකප්පො සො සම්මාචිත්තාභිනිරොපන ලක්ඛණො අප්පණා රසො මිච්ඡාසංකප්පප්පහා නපච්චුපට්ඨානො-සී,

එසේම සම්‍යක්දෘෂ්ටියෙන් බලන්නහුගේද ඒ සම්‍යක්සංකල්පනාවෙන් සිත්හු නිවන් අරමුණෙහි ආරෝපනය කරණුව හුගේද සම්‍යක්දෘෂ්ටි සම්‍යක්සංකල්ප දෙදෙනා හා සම්ප්‍රයුක්තවූ චතුර්විධ වාක් දුශ්චරිතයන් සමුච්ඡේදකරණුවූ මිථ්‍යාවචනයෙන් විරති තොමෝ සම්‍යක්වාචා නම් වෙයි, ඒ සම්‍යක් වාචාතොමෝ විසංවාදනාදි කෘත්‍යය ඇති බැවින් රූක්ෂවූ අපරිග්‍රාහකවූ මුසාවාදදීන්ට ප්‍රතිපක්ෂ බැවින් සනිග්ධභාවයෙන් සම්ප්‍රයුක්ත ධර්මයන් පරිග්‍රහකරණ ලකුණු ඇත්තීය. මිථ්‍යාවචනයෙන් වලක්නා බව කෘත්‍යයකොට ඇත්තීය. මිථ්‍යාවචනය ප්‍රහාණකිරීම ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තීය එසින්කිහ.

තථාපස්සතො විතක්කයතො ච තං සම්පයුත්තාව වචීදුච්චරිත සමුඝාතිකා මිච්ඡාවාචායවිරති සම්මාවාචානාම සා පරිග්ගහලක්ඛණා විරමණරසා මිච්ඡාවාචා පහානපච්චුපට්ඨානා-සී.

ඒ මිථ්‍යාවචනයෙන් විරමණය කරන්නහුට ඒසම්මාවාචාව හා සම්ප්‍රයුක්තවූ ප්‍රාණවධාදී මිථ්‍යාකර්මාන්තයන්ගේ සමුච්ඡේදයවූ ප්‍රාණවධාදීන් කෙරෙන් විරමණය සම්‍යක් කර්මාන්ත නම් වේ. හෙතෙම කායික ක්‍රියාව කිසිකටයුත්තක් උපදවන බැවින් සමුට්ඨාන ලක්‍ෂණකොට ඇත්තේය. නොහොත් දරුබීජනයක් මෙන් සම්ප්‍රයුක්තධර්මයන් නගන ලකුණු ඇත්තේය, මිථ්‍යාකර්මාන්තයෙන් වැලැක්ම කෘත්‍යයකොට ඇත්තේය. ප්‍රාණවධාදී මිථ්‍යකර්මාන්තය ප්‍රහාණක්රීම වැටහීම්කොට ඇත්තේය,

එසින් කිහ.

තථාවිරමතො තං සම්පයුත්තා මිච්ඡාකම්මන්ත සමුච්ඡේදිකා පාණාතිපාතාදී විරති සම්මාකම්මන්තො නාම සො සමුට්ඨාන ලක්ඛණො විරමණ රසො මිච්ඡාකම්මන්ත පහාන පච්චුපට්ඨානො-සී,

ඒ යෝගීහුගේ ඒ සම්‍යක්වාචා සම්‍යක්කර්මාන්ත දෙදෙනා හට විශුද්ධිභූතවූ ඒ සම්‍යක් වාචාදීන් හා සම්ප්‍රයුක්තවූ කුහන ලප නාදීන් උපච්ඡේදකරණුවූ යම් මිථ්‍යාජීවයෙන් විරතියෙක් ඇද්ද ඒ සම්‍යක් ආජීවනම්වේ. ඒ සම්‍යක් ආජීවය තෙමේ පිරිසිදුබව ලක්‍ෂණකොට ඇත්තේය සම්‍යගාජීවයෙන් ජීවමාන සත්ත්වයන්ගේ හෝ සම්ප්‍රයුක්ත ධර්මයන්ගේ හෝ ජීවිතෙන්ද්‍රිය ප්‍රවෘත්තිසංඛ්‍යාත ආජීවයාගේ හෝ ශුද්ධිය වොදාන නමැයි දතයුතුයි. මිනා ආජීවයගේ ප්‍රවෘත්තිය කෘත්‍යයකොට ඇත්තේය. සම්‍යගාජීවයාගේ ප්‍රවෘත්තියෙහි පටන් මිච්ඡාජීවයානොපවත්නා බැවින් බුඩ නිඥිත නොවූ සම්‍යක්ජීවිතාවගේ ප්‍රවෘත්තිය ඤායාජීවප්‍රවෘත්තිනමැයි දතයුතුයි යෙත්. මිථ්‍යාජීවය ප්‍රහීණකිරීම වැටහිම්කොට ඇත්තේය, එයින් කිහ.

යා පනස්ස තෙසං සම්මාවාචා සම්මාකම්මන්තානං විසුද්ධිභූතානං සම්පයුත්තා ච කුහනාදි උපච්ඡේදිකා මිච්ඡාජීවවිරති සම්මාආජීවො නාම සො වොදානලක්ඛණො ඤායාජීවප්පවත්ති රසො මිච්ඡාජීවප්පහාන පච්චුපට්ඨානො-සි.

ඉක්බිත්තෙන් සම්මාවාචාය සම්මාකම්මන්තය සම්මාආජීව යයි කියනලද සීලභූමියෙහි පිහිටි ඔහුගේ සීලභූමියට සුදුසු ඒ සම්මාවාචාදීන් හා සම්ප්‍රයුක්තවූ කොසජ්ජසමුච්ඡේදකවූ සර්වකුශලධ්වංශකවූ යම් සම්‍යක් ව්‍යායාමයෙක් වීර්‍යාරම්භයෙක් ඇද්ද මේතෙමේ සම්‍යක්ව්‍යායාම නම්වෙයි, හෙතෙම නොපසුබැස්ම ලක්‍ෂණකොට ඇත්තේය. නොවූපන් අකුශලධර්මයන් නොවූපදවීමය උපන් අකුශල ධර්මයන් නැසීමය නොවූපන් කුශලධර්මයන් ඉපදවීමය උපන් කුශලධර්මයන් වැඩීමය යන මොවුන් කෘත්‍යය කොට ඇත්තේය මිථ්‍යාව්‍යායාමය නැසීම ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තේය.

එයින් කිහ.

අථස්ස යො තස්සා සම්මාවාචා කම්මන්තා ජීවසංඛාතාය සීලභූමියං පතිට්ඨිතස්ස තදනුරූපො තංසම්පයුත්තොව කොසජ්ජසමුච්ඡේදකො විරියාරම්භො එස සම්මාවායාමො නාම සො පග්ගහලක්ඛණො අනුප්පන්නාකුසලානුප්පාදනාදි රසො මිච්ඡාවායාමප්පහානපච්චුපට්ඨානො-සී.

මෙසේ සම්‍යක්ව්‍යායාමකරණ ඒ යෝගීහට කායාදියෙහි ශුභාදිආකාරයන් ග්‍රහණවශයෙන් ප්‍රවෘත්තවූ ශුභසංඥාව පූර්වාංගම කොට ඇති අකුශල ස්කන්ධයෝම මිථ්‍යාසති නම් වන බැවින් ඒ

මිථ්‍යාසමාධිය නසන්නාවූ සිත්හුගේ අරමුණු සිහි නැති නොවන
බවක් ඇද්ද ඒ සම්‍යක්සති නම් වන්නීය ඒ සම්‍යක්සති තොමෝ
අරමුණු නොවිහිද වැටහෙන බැවින් අරමුණට එළඹ සිටිනා
ලකුණු ඇත්තීය. අරමුණු සිහිනැතිනොවන කෘත්‍යය ඇත්තීය.
මිථ්‍යා සමාධියගේ ප්‍රහාණකිරීම ප්‍රත්‍යුපස්ථානකොට ඇත්තීය

එසින් කීහ.

තස්සෙවං වායමතො තං සම්පයුත්තාව මිච්ඡාසති විනිධුන
තො චෙතසො අසම්මොසො සම්මාසති නාම සා උපඨාන ලක්ඛ
ණා අසම්මුස්සන රසා මිච්ඡාසතිප්පහානපච්චුපඨානා-සී

මෙසේ අනුත්තරසතියෙන් සංරක්ෂියමානවූ චිත්තයාගේ ඒ
සමාධිය හා සම්ප්‍රයුක්තවූ මිථ්‍යාසමාධිය නසන්නාවූ චිත්තෛකා
ග්‍රතාතොමෝ සම්‍යක්සමාධි නම්වේ, හෙතෙම අවික්ෂෙපලක්ෂණ
ඇත්තේය මනාව පිහිටන බව කෘත්‍යයකොට ඇත්තේය මිථ්‍යා
සමාධිය ප්‍රහාණය කිරීම් වැටහීම් කොට ඇත්තේය,

එසින් කීහ.

එවං අනුත්තරාය සතියා සංරක්ඛියමාන චිත්තස්ස තං සම්ප
යුත්තාව මිච්ඡාසමාධි විධංසිකා චිත්තෙකග්ගතා සම්මාසමාධිනාම
සො අවික්ඛෙපලක්ඛණො සමාධානරසො මිච්ඡාසමාධිප්පහාන
පච්චුපඨානො-සි.

මේ මෙහි ජාතිආදීන්ගේ විනිශ්චය වශයෙන් විනිශ්චයවෙදි
තව්‍යයි ඤාණකිච්චතො යනුයෙහි සත්‍යයන් අරභයා පවත්නා
ඤාණයාගේ කෘත්‍යය වශයෙන් විනිශ්චය දතයුතුය යන අර්ථයි.
ඒ එසේමය සත්‍යඥානය තෙමේ අනුබොධඥානය පටිබොධඥාන
යයි කියා ද්විවිධ වෙයි. එහි අනුබොධ ඥානය නම් ප්‍රත්‍යක්ෂකොට
නොදනුතුදු අනුශ්‍රවය අනුව දන්නා නුවණ අනුබොධඥාන නම්
වෙයි. නොහොත් නැවත නැවත උපදනා බැවින් පළමු පළමු
උපන් නුවණ අනුවදන්නා නුවණය ප්‍රතිවෙධකරණ නුවණ පටි
බොධඥාන නම්වෙයි. "චතුන්නං භික්ඛවෙ සච්චානං අනනුබොධා
අප්පටිවෙධා" යනතන්හි අනනුබොධනම විදර්ශනාක්ෂණයෙහි ප්‍රති
වෙධඥානය මාර්ගක්ෂණයෙහි වනබැවින් මෙතන සත්‍යඥානවිවිධ
කොටකීහසියෙන්, ඒ අනුබොධය පටිබොධය යන ඤාණදෙක්හි
අනුබොධඥානය ලෞකිකවූයේ අනුස්සව ආකාර පරිවිතක්ක දිට්ඨි
නිජ්ඣානක්ඛන්ති විසින් නිරොධයෙහිදු මාර්ගයෙහිදු පවති ප්‍රතිවෙ
ධඥානය ලොකොත්තරවූයේ නිවන්අරමුණුකොට පරිජානනාදී
කෘත්‍යය වශයෙන් චතුස්සත්‍යයන් ප්‍රතිවෙධ කෙරෙයි,

## එසින් කීහ.

ඤාණකිච්චතොති සච්චඤාණස්ස කිච්චතොපි විනිච්ඡයො වෙදිතබ්බොති අත්‍ථො දුවිධංහි සච්චඤාණං අනුබොධඤාණඤ්ච පටිවෙධඤාණඤ්ච තත්‍ථ අනුබොධඤාණං ලොකියං අනුස්සවාදිවසෙන නිරොධෙ මග්ගෙ ච පවත්තති පටිවෙධඤාණං ලොකුත්තරං නිරොධමාරම්මණං කත්වා කිච්චතො චත්තාරිපි සච්චානි පටිවිජ්ඣති–යි.

ඒ පරිඥාතනාදි කෘත්‍යය කිරීමෙන් පරිඥෙය්‍යාදීන් මෙන් සත්‍යයෝද ඒ ප්‍රතිවෙධ ඥානයට ප්‍රකටවෙත් විවට්ටානුපස්සනාවෙන් සංස්කාරයන් කෙරෙන් පතිලීයමාන මනස් ඇත්තාහුට උපදනා මහනුවණ විසංස්කාරවූ දුක්ඛනිරොධය අරමුණුකොට දුක්ඛයද පිරිසිඳින්නේය දුක්ඛගත තෘෂ්ණාව පහවන්නේය නිරොධයද සාක්ෂාත් කරන්නේය ස්වභාවයෙන් ප්‍රකටවන ආදිත්‍යයා මෙන් සම්මාසංකප්පාදීන් සමග පවත්නන්නේය මාර්ගයද වඩන්නේය මෙසේ හෙයින් මේ කෘත්‍යයන් කරණ නුවණ දුක්ඛාදියෙහි සම්මොහනිවර්තනයෙන් එකප්‍රතිවෙධනයෙන් චතුස්සත්‍යයන්ම ප්‍රතිවෙධකෙරෙයි දතයුතු,

## එසින් වදාළහ.

සො භික්ඛවෙ දුක්ඛං පස්සති දුක්ඛසමුදයම්පි සො පස්සති දුක්ඛනිරොධම්පි පස්සති දුක්ඛනිරොධගාමිනී පටිපදම්පි පස්සතීති–යි.

ඒ ප්‍රතිවෙධ ඥානයාගේ පරිඥාතනාදී කෘත්‍යය ඇති ඤාණය විශුද්ධිමාර්ගයෙහි ඤාණදස්සන විසුද්ධිකථාවෙහි කී ක්‍රමයෙන් ගන්නේය. යම් ලෞකිකවූ අනුබොධඤාණ කෙණෙක් ඇද්ද ඒ නුවණෙහි දුඃඛඥානය උත්පත්තියම විසින් පවත්නේ සංස්කාර පුඤ්ජමාත්‍රවූ දර්ශනයෙන් සක්කායදිට්ඨිපරියුට්ඨානය වලක්නේය සමුදය ඤාණය හෙතුඵලසම්බන්ධයන්ගේ අවිච්ඡෙදය දක්නාබැවින් පරියුට්ඨානාභිභව විසින් පවත්නා උච්ඡෙදදෘෂ්ටිය වලක්නේය, නිරොධ ඤාණය හෙතුනිරොධයෙන් ඵලනිරොධයදක්නාබැවින් ශාස්වත දෘෂ්ටිය වලක්නේය මාර්ගඥානය නත්‍ථිඅත්තකාරෙ නත්‍ථි පරකාරෙ නත්‍ථි පුරිසකාරෙ යනාදීන් අක්‍රියදෘෂ්ටිය වලක්නේය දුඃඛඥානය හෝ ධ්‍රුව ශුභ සුඛාත්මභාව රහිතවූ ස්කන්ධයන් කෙරෙහිද්‍ර ධ්‍රුව සුභ සුඛාත්මභාව සංඥා සංඛ්‍යාතවූ සමුදය ඵලවූ දුක්ඛයෙහි විප්‍රතිපත්තිය වලක්නේය, "ඉස්සරො ලොකං පවත්තෙති සඤ්ජති නිවත්තෙති සංහරතියි" යනුවෙන් ඊශ්වරකාරණවාදීහු කියති. "පධානතො ලොකො ආවිභවති තත්‍ථෙවච පතිලීයති" යනුවෙන් ප්‍රධාන කාරණවාදීහු කියති,

කාලො කරොති භූතානි කාලො සංහරති පජා
කාලො සුත්තෙසු ජාගරති කාලොහි දුරතික්කමොයි.

යනුවෙන් කාලවාදීහු කියත්, කණ්ටකයන්ගේ කපිත්ථඵලාදීන්ගේ පරිමණ්ඩලභාවය මෙන් මෘගපක්ෂි ආදීන්ගේ විචිත්‍රභාවය මෙන් ස්වභාවයෙන් මේ ලෝකය වන්නේයයි ස්වභාවවාදීහු කියති, ආදිග්‍රහණයෙන් අනුභිලෝකො පවත්තති යනාදී ගත්හු. මෙසේ අකාරණයෙහි කාරණාභිමාන වශයෙන් පවත්නා හේතුයෙහි විප්‍රතිපත්තිය සමුදයසත්‍යය වලක්නේය. **උද්දක ආලාරාදීන්** මෙන් අරූප ලෝකයෙහිද නිගණ්ඨයන් ලෝකථූපිකාවෙහිද මොක්ෂයයි ගන්නා නිරොධ විප්‍රතිපත්තිය නිරොධසත්‍යය වලක්නේය. ඉන්ද්‍රිය තර්පණ පුත්‍රමුඛ දර්ශනාදි මිස අපවර්ගනැතැයි ගෙණ තථා ප්‍රවෘත්තිසංඛ්‍යාත කාමසුඛල්ලිකානුයොගය කේශලුඤ්චනාදී තපශ්චර්යාවෙන්ද ගොසීල කුක්කුටසීලාදීන්ද ආත්ම පරිතාපනයෙන් මොක්ෂයාගේ සිද්ධියවෙයි කාරණ කාමසුඛල්ලිකානුයොගය අත්තකිලමථානුයොගය යන ප්‍රභෙදය ඇති අවිශුද්ධමාර්ගය විශුද්ධමාර්ගයයි ග්‍රහණවශයෙන් ප්‍රවෘත්තවූ උපායෙහි විප්‍රතිපත්තිය මාර්ගසත්‍යය වලක්නේය දක්වනලදමැයි.

**විශුද්ධිමාර්ගයෙහි.**

යං පනෙතං ලොකියං තත්‍ථ දුක්ඛසච්චං පරියුට්ඨානාභිභව වසෙන පවත්තමානං සක්කායදිට්ඨිං නිවත්තෙති, සමුදයසච්චං උච්ඡෙදදිට්ඨිං, නිරොධසච්චං සස්සතදිට්ඨිං මග්ගසච්චං අකිරියදිට්ඨිං, දුක්ඛසච්චං වා ධුව සුභ සුඛත්තභාව රහිතෙසු ඛන්ධෙසු ධුවසුභසුඛත්තභාවසඤ්ඤාසංඛාතං ඵලෙ විප්පටිපත්තිං; සමුදයසච්චං ඉස්සරපධාන කාලසභාවාදිහි ලොකො පවත්තතීති අකාරණෙ කාරණාභිමානප්පවත්තං හෙතුම්හි විප්පටිපත්තිං; නිරොධසච්චං අරූපලොකෙ ලොකථූපිකාදිසු අපවග්ගගාහභූත නිරොධවිප්පටිපත්තිං මග්ගසච්චං කාමසුඛල්ලිකඅත්තකිලමථානුයොගප්පභෙදෙ අවිසුද්ධිමග්ගෙ විසුද්ධිමග්ගගාහවසෙන පවත්තං උපායෙ විප්පටිපත්තිං නිවත්තෙති-යි.

අපිච ලෝකයයි කියනලද පස්කඳු කෙරෙහිද ලෝකප්‍රභවයයි කියනලද ඒ පස්කඳුන් උපයන්නහු කෙරෙහිද ලෝකාපගමයයි කියනලද ඒ පස්කඳුන්ගේ අපගමවූ නිවන්හිද තදුපායයයි කියනලද ඒ පස්කඳුන්ගේ අපගමයට උපායවූ මාර්ගයෙහිද සත්වතෙමේ යම්තාක්කල් සත්‍යයන් නොදනීද ඒතාක්කල් මූළ්හවන්නේය.

## එයින් කීහ.

ලොකෙ ලොකප්පභවෙ ලොකත්ථගමෙ සිවෙ ච තදුපායෙ
සම්මුය්හති තාව නරො න විජානාති යාව සච්චානී-ති.

මේ ගාථාවෙහි "ලොකෙ"යන්නෙන් දුඃඛසත්‍යයද, "ලොකප්පභවෙ" යන්නෙන් සමුදයසත්‍යයද "ලොකත්ථගමෙසිවෙ" යන්නෙන් නිරොධසත්‍යයද, "තදුපායෙ" යන්නෙන් මාර්ගසත්‍යයද, සඞ්ග්‍රහවූ පරිදි සප්‍රාඥයන් විසින් යථාක්‍රමයෙන් පිරික්සිය යුතු, මෙසේ චතුරාර්‍ය්‍යසත්‍යයන් කෙරෙහි ස්වූණ කෘත්‍යයෙනුදු විනිශ්චය දතයුතු. අඥාන'ගධානංපඥහඳ යනුවෙහි දුඃඛසත්‍යයෙහි චතාර්ගී තෘෂ්ණාවද අනාශ්‍රවධර්මයනුදු තබා සෙසු එකාසූ ලෞකික ධර්මයෝ ඇතුළත්වෙත්. සමුදය සත්‍යයෙහි අධ්‍යාත්මික බාහිරවූ ෂාඩායතනයන් කෙරෙහි කාම භව විභව තෘෂ්ණා විසින් සතිස්වැදෑරුම්වූ තෘෂ්ණාවිචරිතයෝ ඇතුළත් වෙත්. නිරොධසත්‍යය එකක්ම බැවින් කිසිවක්හු නොමුසුවේ අනන්තර්ගත නැතිවෙ මාර්ගසත්‍යයෙහි සම්‍යක් දෘෂ්ටිවාරයෙන් විමංසිද්ධිපාද පඤ්ඤින්ද්‍රිය ප්‍රඥාබල ධර්මවිචයසම්බොධ්‍යඞ්ගයෝ සංගෘහීත වෙත්. වීමංසිද්ධිපාදාදී බොධිපාක්ෂික ධර්මයන්ගේ කෘත්‍යය නානාත්වව ඇතද ධර්මභෙයින් එකක් බැවින් කිසිවක්හු සම්‍යක් දෘෂ්ටියෙහි සංග්‍රහවෙයි සම්‍යක්දෘෂ්ටි මුඛයෙන් තදන්තර්ගත භාවය කියන ලද්දැයි දතයුතුවෙත්. සම්‍යක්සංකල්ප ප්‍රදෙශයෙන් නෛෂ්ක්‍රම්‍ය විතර්කය අව්‍යාපාදවිතර්කය අවිහිංසාවිතර්කය යන ත්‍රිවිධවිතර්කයෝ සංගෘහීතවෙත්.

ලොකියකඛණෙ ආලොභ මෙත්තා කාරුණා සමප යාගව සෙන භින්නා මග්ගකඛණෙ ලොභ ව්‍යාපාද විහිංසා සමුච්ඡෙද වසෙනතයො එකොව වුත්තො එසනයො සම්මාවාචාදිසු, යනු මෙයට

### විශුද්ධිමාර්ග ටීකායි.

කාමවිතර්කයෙහි දෝෂ දැක ඒ නසන පිණිස ප්‍රතිපන්නාංගහට උපන් මාර්ගයෙහි විතර්කය නෙක්ඛම්ම විතර්කය නම්වෙයි. සෙසු දෙවිතර්කයෝද එසේමැයි අශුභධ්‍යාන පාදකකොට ඉපදවූ මාර්ගයෙහි විතර්කය නෛෂ්ක්‍රම්‍ය විතර්ක නම්වෙයි, මෛත්‍රීධ්‍යානපාදකකොට ඉපදවූ මග්ගෙහි විතර්කය අව්‍යාපාද විතර්ක නම්වෙයි, කරුණාධ්‍යානපාදකකොට ඉපදවූ මගෙහි විතර්කය අවිහිංසා විතර්ක නම්වෙයි, විභඞ්ගඅටුවාවෙහි කීහයි යෙත්, සම්‍යක්වාචා ප්‍රදෙශයෙන් කථනයෙන් චතුර්විධ වාක්සුචරිතයෝ සංග්‍රහ

වෙත්, මුසාවාදාදී චතුර්විධ වාග්දුශ්චරිතයෙන්වත් සතර විරති හුම චතුර්විධ වාක්සුචරිතනම්වෙති දන්නේ කායසුචරිතයෙහිදු මෙම නියායි යෙත්, සම්‍යක්කර්මාන්ත ප්‍රදෙශයෙන් ත්‍රිවිධ කාය සුචරිතයෝ සංග්‍රහවෙත්, සම්‍යගාජීව මුඛයෙන් අපිස් සතොස් ගුණ ඇත්තාහට සම්‍යගාජීවය වන බැවින් අප්පිච්ඡතා සන්තුට්ඨි තාවෝද සංග්‍රහවෙත්, සියලු ඒ සම්මාවාචා කම්මන්තාජීවයන් භවාන්තරයෙහිදු ජීවිතහෙතුවෙතුදු ආර්‍ය්‍යයන් විසින් අනතික්‍රමණීයවූ ආර්‍ය්‍යකාන්ත සීලනම්වනබැවින් සීලයද ශ්‍රද්ධාහස්තයකින්ගතයුතුබැවින් සද්ධින්ද්‍රිය සද්ධාබල ඡන්දිද්ධිපාදයන්ගේඅස්තිත්වයෙන් සීලයාගේ අස්තිත්වය වන බැවින් සද්ධින්ද්‍රිය සද්ධාබල ඡන්දිද්ධිපාදයෝ සංගෘහිතවෙත්, සම්මාවාචාදී සීලයන්ගේ ග්‍රහණයෙන් යම්ශ්‍රද්ධාහස්තයකින් ඒසීලයෝ ගන්නාලැබෙද්ද ඒ ශ්‍රද්ධාහස්තයද ගෘහීතම වේනුයි, ඒ ශ්‍රද්ධාවෙන් අනන්‍යවූ සද්ධෙන්ද්‍රිය සද්ධාබලයෝ සංගෘහිතවෙත්,ඡන්දිද්ධිපාදය වනාහී ශ්‍රද්ධාගුණහෙයින් ඡන්දිද්ධිපාදයද තදන්තර්ගතවෙතියි දතයුතුයි,යෙත් සම්‍යක් ව්‍යායාම ප්‍රදෙශයෙන් චතුර්විධ සම්‍යක් ප්‍රධානයහා විරියින්ද්‍රිය වීර්‍ය්‍යබල වීර්‍ය්‍යසම්බොධ්‍යඞ්ගය යන මොහු සංග්‍රහවෙත්. සම්‍යක්සතිය කීමෙන් චතුර්විධ සතිපට්ඨානය සතින්ද්‍රිය සතිබලය සතිසම්බොජ්ඣඞ්ගය යන මොහු ඇතුළත් වෙත්, සම්‍යක්සමාධියගේ කීමෙන් සවිතර්ක සවිචාරාදී ත්‍රිවිධසමාධිය චිත්තිද්ධිපාදය සමාධින්ද්‍රිය සමාධිබලය පීති ප්‍රශ්‍රබ්ධි උපෙක්‍ෂා සම්බොධ්‍යඞ්ගයෝ ඇතුළත්වෙත්, මෙසේ අන්තර්ගතයන්ගේ ප්‍රභෙද විසිතුදු විනිශ්චය දතයුතුයි,

### මේද දක්වන ලදමැයි විශුද්ධිමාර්ගයෙහි

අනොතගධානං පභෙද'ති දුක්ඛසච්චස්මිං හි ඨපෙත්වා තණ්හාචෙව අනාසව ධම්මෙච සෙසා සබ්බධම්මා අනොතගතා සමුදයසච්චෙ ඡත්තිංස තණ්හා විචරිතානි නිරොධසච්චමසම්මිස්සං මග්ගසච්චෙ සම්මාදිට්ඨි මුඛෙන වීමංසිද්ධිපාද පඤ්ඤින්ද්‍රිය පඤ්ඤාබල ධම්මවිචයසම්බොජ්ඣඞ්ගානි සම්මාසංකප්පාපදෙසෙන තයො නෙක්ඛම්ම විතක්කාදයො, සම්මාවාචාපදෙසෙන චත්තාරි වචීසුචරිතානි, සම්මාකම්මන්තාපදෙසෙනතීනි කායසුචරිතානි. සම්මාජීවමුඛෙන අප්පිච්ඡතා සන්තුට්ඨිතාච සබ්බසඞ්ගසච්චා එතෙසං සම්මාවාචා කම්මන්තා ජීවානං අරියකන්තසීලත්තා සීලස්සච සද්ධාහත්ථෙන පටිග්ගහෙතබ්බත්තා එතෙසං අත්ථිතාය අත්ථිභාවතො සද්ධින්ද්‍රිය සද්ධාබල ඡන්දිද්ධිපාදා; සම්මාවායාමාපදෙසෙන චතුබ්බිධ සම්මප්පධාන විරියින්ද්‍රිය විරියබල විරියසම්බොජ්ඣඞ්ගානි, සම්මාසති අපදෙසෙන චතුබ්බිධ සතිපට්ඨාන සතින්ද්‍රිය සතිබල සතිසම්බොජ්ඣඞ්ගානි, සම්මාසමාධි අපදෙසෙන සවිතක්ක සවිචාරාදයො තයො සමාධි, චිත්තසමාධි සමාධින්ද්‍රිය සමාධිබල පීති පස්සද්ධිසමාධි උපෙක්ඛා සම්බොජ්ඣඞ්ගානී, අනොතගධානී'ති එවමෙත්ථ අනොතගධානං පභෙදොපි විනිච්ඡයො වෙදිතබ්බො—ති,

**උපමාතො** යන්හෙහි මෙම චතුරාර්‍ය්‍යසත්‍ය ධර්‍මයන් උපමා විසිනුදු දතයුතුය යන අර්‍ථයි, හේ කෙසේදයත්? දුක්ඛසත්‍යය තෙමේ සංස්කෘත වසයෙන් පෙළෙන බැවින් භාරයක්මෙන් දතයුතුය, සමුදයසත්‍යය තෙමේ ඒ ඒ භවයෙහි උපදනා දුක්ඛයට හෙතුවන බැවින් භාරයාගේ ගැන්මක්මෙන් දතයුතුය, නිරොධසත්‍යය ප්‍රවෘත්තදුක්ඛයාගේ ව්‍යුපශමනයක් බැවින් භාරය බහාතිබීමක් සෙයින් දතයුතුය. මාර්‍ගසත්‍යය ප්‍රවෘත්තදුක්ඛ ව්‍යුපශමයට හෙතු බැවින් භාරය බහාතබන්ට කරණ උපායක් සෙයින් දතයුතුය, අපිච, පීඩාකරණ අර්‍ථයෙන් දුක්ඛසත්‍යය රොගයක් සෙයින් දතයුතුය, ප්‍රභව ලකුණු බැවින් සමුදයසත්‍යය රොගයාගේ උත්පත්තියට කාරණයක් නිදානයක් බඳුය, නිරොධසත්‍යය ශාන්ත ලකුණු බැවින් සුවබවක් රොගව්‍යුපශමයක් සන්සිඳීමක් දුක්ඛහෙතුව හිඳුනා බැවින් රොගයාගේ අපගමයක් බඳුය උපසමනයට උපාය බැවින් නෛර්‍ය්‍යාණිකලක්ෂණ මාර්‍ගසත්‍යය බෙහෙදක් බඳුය. අපිච බාධක බැවින් දුක්ඛසත්‍යය දුර්භික්ෂයක් බඳුය ප්‍රභව ස්වභාව බැවින් සමුදයසත්‍යය වෘෂ්ටියක් විසම වර්‍ෂාවක් බඳුය, නිරොධසත්‍යය ශාන්තලක්ෂණ හෙයින් සුව බැවින් සුභික්ෂයක් බඳුය, දුක්ඛහෙතුව සිඳුනාබව හෙයිනුදු ඔහුගේ අපගමයට උපාය බැවිනුදු නිර්‍ය්‍යාණලක්ෂණ මාර්‍ගසත්‍යය සුවෘෂ්ටියක් බඳුය.

මේද දක්වන ලදමැයි.

උපමාතො'ති භාරො විය හි දුක්ඛසච්චං දට්ඨබ්බං භාරාදානමිව සමුදය සච්චං, භාර නික්ඛෙපනං විය නිරොධසච්චං, භාරනික්ඛෙපනුපායො විය මග්ගසච්චං. රොගො විය දුක්ඛසච්චං රොගනිදානමිව සමුදයසච්චං රොගවූපසමො විය නිරොධසච්චං භෙසජ්ජමිව මග්ගසච්චං දුබ්භික්ඛමිව වා දුක්ඛසච්චං දුබ්බුට්ඨිවිය සමුදය සච්චං සුභික්ඛමිව නිරොධසච්චං සුවුට්ඨිවිය මග්ගසච්චං අපිච.

වෙරිවෙරමූලවෙරසමුග්ඝාතවෙරසමුග්ඝාතුපායෙහි විසරුක්ඛරුක්ඛමූල මූලුපච්ඡෙද තදුපච්ඡෙදුපායෙහි භය භයමූල නිබ්භය තදධිගමුපායෙහි ඔරිමතීර මහොඝ පාරිමතීර තං සම්පාපකවායාමෙහි ච යොජෙත්වා පෙතාති උපමාතො වෙදිතබ්බානි-ති.

දක්වනලද උපමා වශයෙන්ද මෙසේ චතුරාර්‍ය්‍ය සත්‍යයන්ගේ විනිශ්චය දතයුත්තේය, දෙවෙනි පාඨපඞ්ක්තියෙන් දැක්වූ උපමාවන් අතුරෙහි වෛරනම්, ව්‍යාපාදයයි ප්‍රතිපක්ෂබවහෝයි වෙරමූලනම් ආක්‍රොශ වස්තුයි වෛර. සමුග්ඝාතනම් වෛර සන්හිඳීමය මෛත්‍රියහෝයි. වෛරසමුග්ඝාතුපාය නම් සංග්‍රහ වස්තුයි. **චතුක්කතො** යන්හෙහිද **සුඤ්ඤතො** යන්හෙහිද විනිශ්චය විශුද්ධිමාර්‍ගයෙහ ආ ක්‍රමයෙන් දතයුතු. **එකවිධාදයි** යන්හෙහි විනිශ්චය කෙසේදයත්? මොවුන්කෙරෙහි සියලුම දුක්ඛය

සංසාර ප්‍රවෘත්ති බැවින් එකවිධවෙයි, නාමරූප විසින් ද්විවිධවෙයි, කාමූපපත්තිභවය රූපූපපත්තිභවය අරූපූපපත්තිභවය යන ප්‍රභේද විසින් ත්‍රිවිධවෙයි, මෙයින් විපාකස්කන්ධයන්ම දුක්ඛ සත්‍යය බව කීහු, සතරආහාර ප්‍රත්‍යය විසින් චතුර්විධවෙයි, මෙයින් කබලිංකාරාදී සතර ආහාර විහාර විශේෂයන්ද අභ්‍යාවහරණීය වස්තුය සචෙතනාය අවිද්‍යාය අභිසංස්කාරයයි කියනලද තත්ප්‍රත්‍යයවූ ධර්ම විශේෂයන්ද ඕජාෂ්ටමක රූපය වේදනාය ප්‍රතිසන්ධිවිඥානය නාමරූපය යන තන්නිඃසෘත ධර්ම විශේෂයන්ද සංග්‍රහකළෝ ප්‍රවෘත්තිද දුක්ඛයට ප්‍රවෘත්තික බැවිනැයි දතයුතු. පඤ්චොපාදානස්කන්ධභේදයෙන් පචවිධවේ.

එයින් කීහ.

සබ්බමෙවවෙතං දුක්ඛං එකවිධං පවත්තිභාවතො, දුවිධං නාම රූපතො, තිවිධං කාමරූපාරූපූපපත්තිභාව භෙදතො චතුබ්බිධං චතු ආහාර භෙදතො පචවිධං පචපාදානක්ඛන්ධභෙදතො-ති.

සමුදය සත්‍යය දුක්ඛය පවත්වන බැවින් එකවිධවෙයි, දෘෂ්ටිය හා සම්ප්‍රයුක්තය අසම්ප්‍රයුක්තය යන ප්‍රභේදයෙන් ද්විවිධවෙයි, කාමතෘෂ්ණාවය භවතෘෂ්ණාවය විභවතෘෂ්ණාවයයන භේදයෙන් ත්‍රිවිධවෙයි. සතරමාර්ගයෙන් ප්‍රහාතව්‍ය බැවින් සතරමාර්ගයන්ගේ භේදයෙන් චතුර්විධ වෙයි. රූපාදි පචස්කන්ධයෙහි අභිනන්දන වශයෙන් හෝ රූපාලම්බනාදි වශයෙන් හෝ පචවිධවෙයි, ෂට් තෘෂ්ණා කායභේදයෙන් ෂඩ්විධ වෙයි. මෙහි රූපතෘෂ්ණාදීහු ප්‍රත්‍යෙකයෙන් අනෙක භේද භින්න හෙයින් තෘෂ්ණාකාය නම්වෙත් ඔවුන්ගේ භේදයෙනැයි සේයි,

එයින් කීහ.

සමුදයොපි එකවිධො පවත්තකභාවතො, දුවිධො දිට්ඨිසම්පයුත්තාසම්පයුත්තතො, තිවිධො කාම භව විභව තණ්හා භෙදතො, චතුබ්බිධො චතුමග්ගප්පභෙදතො, පචවිධො රූපාභිනන්දනාදි භෙදතො, ඡබ්බිධො ඡතණ්හා කායභෙදතො-ති.

නිරොධය තෙමේ අසංඛත ධාතුභාවයෙන් එකවිධවෙයි. පර්‍යායයයි කියනලද ව්‍යවහාර වශයෙන් වනාහි සොපාදිශෙෂ අනුපාදිශෙෂ වශයෙන් ද්විවිධවෙයි මෙහි "උපාදානෙහි උපාදීයතීති උපාදි" උපාදානයන් විසින් ගන්නාලැබේයුයි (උපාදානස්කන්ධපචකය) උපාදි නම් වෙයි. තන්නිස්සරණවූ නිර්වාණය උපාදානස්කන්ධපචකය ව්‍යපශමනය කෙරේනුයි ඔහුගේ පශ්චිම චිත්තය දක්වා ශෙෂතාවද එයින් මතුයෙහි අනවශෙෂතාවද නිසා සොපාදිසෙස නිර්වාණධාතුය නිරුපාදිශෙෂ නිර්වාණධාතු

යයි ද්විවිධයයි ව්‍යවහාර කරණු ලැබෙයි. යම්සේ මේ භේදය ව්‍යවහාර වශයෙන් වේද එසේම සෙසු භේදයෝත් වෙතියි දක්වන පිණිස තිවිධො යනාදීන් කියනලදූයි යෙත්, භවත්‍රය ව්‍යුපශමනය කරණ හෙයින් ත්‍රිවිධවේ සතරමාර්ගයෙන් පැමිණියයුතු බැවින් චතුර්විධ වෙයි, රූපාභිනන්දනාදී පඤ්චාභිනන්දනයන් සන්සිඳුවන බැවින් පඤ්චවිධවෙයි, තණ්හාකායෂට්කය භේදයෙන් ෂට්විධ වෙයි,

එයින් කීහ.

නිරොධොපි එකවිධො අසංඛත ධාතුභාවතො පරියායෙන ද්විවිධො සඋපාදිසෙස අනුපාදිසෙසතො, තිවිධො භවත්තය වූපසමතො, චතුබ්බිධො චතුමග්ගාදි ගමනීයතො, පඤ්චවිධො පඤ්චාභිනන්දන වූපසමතො ඡබ්බිධො ඡතණ්හා කායක්ඛය භෙදතො-යි.

මාර්ගසත්‍යයද භාවිතව්‍ය බැවින් එකවිධවෙයි, සමථවිදර්ශනාදී බැවින් ද්විවිධවෙයි, මෙහි සම්මාදිට්ඨි සම්මාසංකප්ප දෙදෙන විපස්සනාංග හ ඉතරයෝ සමථාංග සීලයද සමථයට උපකාර බැවින් සමථ ග්‍රහණයෙන් ගන්නා ලැබෙයි ඔවුන්ගේ අභිප්‍රායයි යන චිය වශයෙන් ලබ්ධවූ මාර්ගය සමථ විදර්ශනායයි ආගමන වසයෙන් භෙද කියනලදූයි දතයුතු විදර්ශනා මාර්ගය භාවනා මාර්ගය යන භේදයෙන් හෝ ද්විවිධවෙයි. ශීලස්කන්ධය සමාධිස්කන්ධය ප්‍රඥාස්කන්ධය යන ස්කන්ධත්‍රය භේදයෙන් ත්‍රිවිධ වෙයි. ශ්‍රොතාපත්ත්‍යාදී මාර්ග වශයෙන් චතුර්විධවෙයි.

එයින් කීහ.

මග්ගොපි එකවිධො භාවෙතබ්බතො, දුවිධො සමථවිපස්සනා භෙදතො දස්සනභාවනා භෙදතොවා, තිවිධො ඛන්ධත්තය භෙදතො චතුබ්බිධො සොතාපත්තාදී මග්ගවසෙන-යි.

අනිකුදු, සියලුම සත්‍යයෝ අවිතථ බැවින් තිබොරු බැවින් එකවිධවෙයි, අභිමුඛකොට ප්‍රත්‍යක්ෂ වශයෙන් දතයුතු බැවින් හෝ විශිෂ්ටඥානයෙන් දතයුතු බැවින් හෝ එකවිධවේ. දුක්ඛ සමුදය දෙදෙනා ලෞකික වශයෙන්ද නිරොධමාර්ග දෙදෙනා ලොකොත්තර වසයෙන්ද හැඟෙන බැවින් ලෞකික ලොකොත්තරවසින් හෝ ද්විවිධ වෙයි, නිරොධය අසංඛතය සෙස්ස සංඛතයයි කියා හෝ ද්විවිධවෙයි, දර්ශනාදී විසින් ත්‍රිවිධවෙයි. පරිඥෙය්‍ය පහාතබ්බ සච්ඡිකාතබ්බ භාවෙතබ්බ භේදයෙන් චතුර්විධවෙයි,

එයින් කීහ.

අපිච සබ්බානෙව සච්චානි එකවිධානි අවිතථත්තා අභිඤ්ඤෙය්‍යත්තා වා දුවිධානි ලොකිය ලොකුත්තරතො සංඛතා සංඛතතො වා තිවිධානි දස්සනභාවනාහි පහාතබ්බතො අප්පහාතබ්බතො ච චතුබ්බිධානි පරිඤ්ඤෙය්‍යාදි භෙදතො-යි.

මෙසේ ඒකවිධාදි භේදයෙන් විනිශ්චය දතයුතුයි. සභාග විසභාගතො යත්නෙහි සියලු සත්‍යයෝම අවිතථ බැවින්ද ආත්මශූන්‍ය බැවින්ද දුෂ්කරවූ ප්‍රතිවෙධ ඇති බැවින්ද සදෘශයෝය. ඒ එසේමය යමෙක් දුරැතැනෙක සිට කෙසි සිදුරෙන් ශරය විදීද හෙද පළමුයත ශරපොංඛයෙහි හෙවත් දුන්නෙහි පසුපසුව විදි ශරයෙහි ශරතුඩ නොවරදවා විදීද යමෙක් හෝ සියක්වරක් ඉරනලද අස්ලොමෙහි කෙළවරින් වැදී අනික් කෙළවරින් නික්මෙන ලෙසට ප්‍රතිමුඛභාවයෙන් විදුනේද මෙයටත් වඩා චතුස්සත්‍යය ඇතිලෙස දැනගැන්ම දුෂ්කර වන්නේය.

වදුළේ මැනෝ.

තං කිම්මඤ්ඤසි ආනන්ද කතමන්නුඛො දුක්කරතරං වා දුරභිසම්භවතරං වා යො වා දූරතොව සුඛුමෙන තාලච්ඡිග්ගලෙන අසනං අතිපාතෙය්‍ය පොංඛානුපොඞ්ඛං අවිරාධිතං යො වා සතධාභින්නස්ස වාලස්ස කොටියා කොටිං පටිවිජ්ඣෙය්‍යාති එතදෙව භනෙත දුක්කර තරමෙව දුරභිසම්භවතරච යො සතධාභින්නස්ස වාලස්ස කොටියාකොටිං පටිවිජ්ඣෙය්‍යාති තතො ඛො තෙ ආනන්ද දුප්පටිවිජ්ඣතරං පටිවිජ්ඣන්ති යෙ ඉදං දුක්ඛන්ති යථාභූතං පටිවිජ්ඣන්ති අයං දුක්ඛසමුදයොති යථාභූතං පටිවිජ්ඣන්ති අයං දුක්ඛනිරොධොති යථාභූතං පටිවිජ්ඣන්ති අයං දුක්ඛනිරොධගාමිනී පටිපදාති යථාභූතං පටිවිජ්ඣන්ති-සි.

බාධකප්‍රභවාදී තමන්ගේ ස්වභාවය නියම විසින් විසභාගයෝයි පළමු දුක්ඛ සමුදය දෙදෙන ඖදාරිකයෝනුයි [illegible] යත්වද ආහාරාදියෙහි තෘෂ්ණාව ප්‍රකටමය ජඩානුග්‍රහතාදී වශයෙන් වනාහි මේ දුක්ඛය මෙයට කාරණයයි තායවූපරිද්දෙන් අවගාහනයට නොපිළිවන් බැවින් ගැඹුරු බැවිනුදු ලෞකික බැවිනුදු සාසව බැවිනුදු සභාගයහ ඵලය හෙතුය යන මොවුන්ගේ භේදයෙන්ද පරිඥෙය්‍යය ප්‍රහාතව්‍යය යන මොවුන්ගේ භේදයෙන්ද විසභාගයහ පශ්චිමසත්‍යවයද ගැඹුරු බැවින්ද දුරවගාහ බැවින්ද ලොකොත්තර බැවින්ද අනාසව බැවින්ද සභාගයහ, විෂය විෂයී බැවින් අරමුණු අරමුණු බැවින්ද සච්ඡිකාතබ්බ භාවෙතබ්බ වසයෙන්ද විසභාගවෙත්, ප්‍රථම තෘතීයවූ දුක්ඛනිරොධ දෙදෙන ඵලයයි කියනු ලබන බැවින් සභාගයහ දුක්ඛය සංඛත බැවින් නිරොධය අසංඛත බැවින් විසභාගයහ දෙවෙනි සතරවැනිවූ සමුදය මාර්ගසත්‍ය දෙදෙන හෙතුයයි කියන ලබන බැවින් සභාගයහ, සමුදය එකාන්ත අකුසල් බැවින්ද මාර්ගය එකාන්තකුසල බැවින්ද විසභාගයහ, ප්‍රථම චතුර්ථවූ දුක්ඛමාර්ග දෙදෙන සංඛත හෙයින් සභාගයහ. දුක්ඛය ලෞකික හෙයින්ද මාර්ගය ලොකොත්තර හෙයින්ද විසභාගයහ. දෙවෙනි තුන්වෙනිවූ සමුදය නිරොධ දෙදෙනද නෙවසෙඛ නාසෙඛ වසයෙන් විසභාගයහ, සාරම්මණ අනාරම්මණ වසයෙන් විසභාගයහ. මේ ක්‍රමයේ මෙබඳු ප්‍රකාර ඇත්තයින් නුවණැත්තෝ ආර්‍ය්‍යසත්‍යයන්ගේ සභාගවිසභාගතාව දන්නේයි, දක්වනලදමැයි.

විශුද්ධිමාර්ගයෙහි,

පුබ්බානිචමෙ සභාගානි දුරවගාහත්තා ගම්භීරත්තා ලොකියත්තා සාසවත්තාච විසභාගානි ඵලහෙතු භෙදතො පරිඤ්ඤෙය්‍යපහාතබ්බතොච පච්ඡිමානිපි චෙ සභාගානි ගම්භීරත්තා දුරවගාහත්තා ලොකුත්තරත්තා අනාසවත්තා ච. විසභාගානි විසයවිසයී භෙදතො සච්ඡිකාතබ්බ භාවෙතබ්බතො ච පඨම තතියානි චාපි සභාගානි ඵලාපදෙසතො විසභාගානි සංඛතා සංඛතතො දුතියචතුත්ථානිචාපි සභානානි නෙව සෙඛ නාසෙඛ භාවතො විසභාගානි සාරම්මණා නාරම්මණතො.

ඉති එවංපකාරෙහි නයෙහිච විචක්ඛණො
විජඤ්ඤා අරියසච්චානං සභාගවිසභාගතං—ති.

මේ මෙසේ විභාගතො නිබ්බචනං යනාදියෙහි පටන්අරිය සච්චානං සභාග විසභාගතං යන මෙතන දක්වා අනෙකප්‍රකාරයෙන් විභාග කරණලද හෙවත්

විභාගතො නිබ්බචන ලක්ඛණාදිප්ප භෙදතො
අත්ථත්ථුද්ධාරතොචෙව අනූනාධික තොතථා
කමතො ජාති ආදීනං නිච්ඡයාඤාණ කිච්චතො
අන්තොගධානං පභෙදා උපමාතො චතුක්කතො.
සුඤ්ඤතෙකවිධාදීහි සභාග විසභාගතො
විනිච්ඡයො වෙදිතබ්බො විඤ්ඤුනා සාසනක්කමෙ-ති.

යන මාතෘකාවෙන් දක්වනලද විභාග නිර්වචනාදි විසින් වර්ණිතාකාර වදරන්නාවූ බුද්ධඝොෂ මහා ස්ථවිරයන්වහන්සෙ ලොකානන්දකරවූ බුදුරජානන්වහන්සේ විසින් වදාළ චතුරාර්‍ය්‍ය සත්‍යනම ගෙණ වර්ණනාකාර වදාළසේක අඤ්ඤාකොණ්ඩඤ්ඤ දීන්ට දම්සක් පැවතුම් සූත්‍රාදියෙහි බුදුන් විසින් අවබොධ කර වූයේත් මේ චතුරාර්‍ය්‍ය සත්‍යමය එසේ අවබොධකර වදාරණසේකුත් තමනවහන්සේ අභිඥෙය්‍යාදී වසයෙන් චතුරාර්‍ය්‍යසත්‍ය ධර්මයන් බොධිද්‍රුමමූල සමීපයෙහිදී දත්හෙයින්මය. එසේ හෙයින් සද්ධර්මාමෘත දායකවූ සද්ධර්මගඞ්ගාප්‍රවාහවූ සමන්තභද්‍රවූ සකල ලොක චින්තාමාණික්‍යවූ ලොකස්වාමිවූ බුදුරජානන්වහන්සේ බුද්ධනම් වනසේක.

එසින් වදාළහ.


අභිඤ්ඤෙය්‍යං අභිඤ්ඤාතං-භාවෙතබ්බංච භාවිතං
පහාතබ්බං පහීණමෙම තස්මා බුද්ධොස්මි බ්‍රාහ්මණාති.

මෙතෙකින්

විශුද්ධිමාර්ගයෙන් සංග්‍රහකළ

## චතුරාර්‍ය්‍යසත්‍ය විභාගය නිමි.

# සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු